

# ආත්මයේ ජීවිතය පිළිබඳව සිතාබැලීම



රූහි ආයතනය





පළමු පොත

# ආත්මයේ ජීවිතය
# පිළිබඳව සිතාබැලීම

රුහි ආයතනය

ග්‍රන්ථ මාලාවෙහි අඩංගු පොත්:

රූහි ආයතනය විසින් නිර්මාණය කරන ලද ග්‍රන්ථමාලාවේ වර්තමාන ග්‍රන්ථ නාමයන් පහතින් දැක්වේ. තරුණයින් සහ වැඩිහිටියන් තමන්ගේ සමාජයන්ට සේවය කිරීමේ හැකියාව ක්‍රමාණුකූලව වර්ධනය කිරීමේ උත්සාහයේ ප්‍රධාන අනුක්‍රමික පාඨමාලාවක් ලෙස මෙම පොත් භාවිතා කිරීමට බලාපොරොත්තු වේ. රූහි ආයතනය විසින් බහායි ළමා පන්ති ගුරුවරුන් පුහුණු කිරීම සඳහාවූ අනු පාඨමාලා කට්ටලයක් තුන්වන පොත මඟින් විහිදී යන පරිදි සකස් කර ඇති අතරම කණිටු යෞවන කණ්ඩායම් සජීවීකාරකයින් නඟාසිටුවීම සඳහා පස්වන පොත මඟින් තවත් පොත් කට්ටලවක් සකස් කර ඇත. මෙම කොටස් දෙක පහත ලැයිස්තුවේ දක්වා ඇත. ක්ෂේත්‍රයේ අත්දැකීම් ප්‍රගතියට පත්වනවාත් සමඟම මෙම ලැයිස්තුවෙහි වෙනස්කම් සිදුවන බව සඳහන් කළ යුතු අතරම, සංවර්ධනය වෙමින් පවතින විෂයමාලා මූලිකාංග පුළුල්ව යෙදවිය හැකි මට්ටමට ළඟාවූ විට තවත් ග්‍රන්ථ නාමයන් මෙයට එකතුවිය හැක.

| | |
|---|---|
| පළමු පොත | ආත්මයේ ජීවිතය පිළිබඳ සිතාබැලීම |
| දෙවන පොත | සේවය සඳහා නැඟී සිටීම |
| තුන්වන පොත | ළමා පන්ති සඳහා ඉගැන්වීම, පළමු ශ්‍රේණිය |
| | ළමා පන්ති සඳහා ඉගැන්වීම, දෙවන ශ්‍රේණිය (අනු පාඨමාලා) |
| | ළමා පන්ති සඳහා ඉගැන්වීම, තුන්වන ශ්‍රේණිය (අනු පාඨමාලා) |
| | ළමා පන්ති සඳහා ඉගැන්වීම, හතරවන ශ්‍රේණිය (අනු පාඨමාලා) |
| හතරවන පොත | ද්විත්ව ප්‍රකාශවීම් |
| පස්වන පොත | කණිටු යෞවනයින්ගේ බලයන් මුදාහැරීම |
| | මූලික පෙළඹවීම: පස්වන පොතෙහි පළමු අනු පාඨමාලාව |
| | චක්‍රය පුළුල් කිරීම: පස්වන පොතෙහි දෙවන අනු පාඨමාලාව |
| හයවන පොත | ධර්මය ඉගැන්වීම |
| හත්වන පොත | සේවා මාර්ගයෙහි එකට ගමන් කිරීම |
| අටවන පොත | බහාඋල්ලා තුමාගේ ගිවිසුම |
| නවවන පොත | ඓයිතිහාසික දෘෂ්ටිකෝණයක් අත්පත්කර ගැනීම |
| දහවන පොත | උද්දීප්ත සමාජයක් ගොඩනැඟීම |
| එකළොස්වන පොත | භෞතික වත්කම |
| දොළොස්වන පොත | (ප්‍රකාශවීමට නියමිත) |
| දහතුන්වන පොත | සමාජ ක්‍රියාකරකම්හි නිරතවීම |
| දාහතර වන පොත | (ප්‍රකාශවීමට නියමිත) |

ප්‍රකාශන හිමිකම: රූහී ආයතතනය, කොළොම්බියාව 2012, 2020
සංස්කරණය. 2020 අගෝස්තු 4.1.1.PE සංස්කරණය

Originally published in Spanish as Reflexiones sobre la vida del espíritu
Copyright © 1987, 1995, 2008, 2020 by the Ruhi Foundation, Colombia
ISBN 978-958-59880-3-3

රූහි ආයතනය
කලී, කොළොම්බියාව
විද්‍යුත් තැපැල: instituto@ruhi.org
Website: www.ruhi.org

# පටුන


උපදේශකවරයා සඳහා අදහස් කිහිපයක් ..........v

බහායි ලේඛණ අවබෝධ කරගැනීම ................1

යාඥා ..........................................................13

මරණින් පසු ජීවිතය .....................................29

# උපදේශකවරයා සඳහා අදහස් කිහිපයක්

රූහි ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රධාන අනුක්‍රමික පාඨමාලාවේ පළමු පොත වන *ආත්මයේ ජීවිතය පිළිබඳ සිතා බැලීම* නම් වූ මෙම පොත ලොව පුරා අධ්‍යනය කරන ලද ප්‍රදේශයන් සංඛ්‍යාව වසර ගණනාවක් පුරා වර්ධනය වෙමින් පවතී. විශාල බහුල අවස්ථාවන්හීදී, අයෙකු විසින් නිරන්තරව මුණගැසීම සඳහා පිහිටුවන ලද අධ්‍යන කවවලදී, ඇතැම්විට තීව්‍ර අධ්‍යයන් සඳහාවූ ව්‍යාපාරයන් සඳහා එක්වීමෙන් හෝ පාසල් නිවාඩු කාලයේදී වූ කඳවුරු වලදී මෙම අධ්‍යනය මිත්‍රයින් කණ්ඩායම් වශයෙන් කියවා සාකච්ඡාවන් සිදු කර ඇත. මෙහිදී උපදේශකවරයා සහ අනෙකුත් සහභාගිවන්නන් අතර සම්බන්ධතාව ගුරුවරයෙකු හා ශිෂ්‍යයෙකු වශයෙන් නොවන අතර සැම කෙනෙකුම ඉගෙනගැනීමට උත්සාහ කිරීමේ ක්‍රියාවලියට අවබෝධාත්මකව සහභාගිවේ. නමුත් උපදේශකවරයා සාකච්ඡාවට පහසුකම් සැපයීමෙන් ලිහිල්වීමක් හෝ අක්‍රියවීමක් සිදුනොවේ. අනුක්‍රමිකයේ ප්‍රමාණවත් පාඨමාලාවන් සංඛ්‍යාවක් සම්පූර්ණ කර තිබීමෙන් සහ එමඟින් උනන්දු කර ඇති සේවා ක්‍රියාකරකම් සිදුකර ඇති ඔහුට හෝ ඇයට කණ්ඩායමේ සැම කෙනෙකුටම අධ්‍යනය මඟින් පෙන්වාදි ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීම උපකාර කළ හැක. පළමු පොත සඳහා උපදේශකවරයෙකු ලෙස ක්‍රියාකිරීමට උනන්දුවන අයෙකු මෙම හඳුන්වාදීමේ කොටසෙහි දක්වා ඇති අදහස් විටින් විට පරීක්ෂාකර බැලීම උපකාරී විය හැක.

මෙම පළමු ආයතනික පාඨමාලාව සඳහා ලොවපුරා විවිධ පසුබිම්වලින් සහභාගිවන්නන් පැමිණ ඇත. ඇතැමුන් දැනටමත් බහායි සමාජයේ සාමාජිකයන් වන අතර තමන් වැලඳගෙන සිටින ධර්මයට සේවය කිරීමේ සඳහා ඔවුන්ගේ හැකියවන් වර්ධනය කරගැනීමට බලාපොරොත්තුවන අය වෙති. අනෙකුත් පිරිස මෙම පාඨමාලව දකින්නේ ආගමක් ලෙස බහායි ධර්මය පිළිබඳ ඔවුන්ගේ විමර්ශනය ආරම්භ කිරීමක් ලෙසයි. තවත් සමහරුන් බහායි අදහස් වෙත ආකර්ෂනයෙන් සහ ඔවුන් සමාජයේ අරමුණු සහ උත්සාහයන්ට එක්වීමට කැමැත්ත දක්වයි. ඔවුන් බොහෝවිට බහායි සමාජය විසින් ප්‍රවර්ධනය කරන මීළඟ වැඩසටහනකදී හෝ අනෙකේදී, විශේෂයෙන්ම සමාජයට සේවය කිරීමට තම හැකියාවන් සංවර්ධනය කරගැනීමට අවශ්‍යතාවක් දක්වන සංඛ්‍යාත්මකව වර්ධනය වන තරුණ ප්‍රජාව මෙම පාඨමාලාව ආරම්භක පියවරක් ලෙස ගනී.

රූහි ආයතනයේ පාඨමාලාවන් මනුෂ්‍ය වර්ගයා සඳහා සේවය කිරීමට අඩිතාලමක් සකස් කරනු ලබන බවත් අනෙකුත් අයට සහායවෙමින් සහ සහාය ලබමින් අප සැම කෙනෙක්ම තමන්ගේම පියවරයන් මත ගමන් කරන බවට සැම සහභාගිවන්නෙකුට ආරම්භයේදීම පැහැදිලි විය යුතුයි. තමාගේම ආධ්‍යාත්මික සහ ප්‍රඥාවන්ත බව වර්ධනය කරගැනීම සහ සමාජ පරිවර්ථනය සඳහා දායකවීමත් යන එකිනෙක බැඳුනු ආධ්‍යාත්මික අරමුණු දෙකකින් මෙම මාර්ගය යුක්තවේ. මෙම මාර්ගයෙහි අභිවෘද්ධිය සඳහා අවබෝධකරගැනීම සහ දැනුම, ආධ්‍යාත්මික ගුණාංග සහ ප්‍රශංසනීය ආකල්ප මෙන්ම හැකියාවෙන් සහ දක්ෂතාවයෙන් යුක්තවීම යන දක්ෂතාවයන් ගණනක් සංවර්ධනය කරගැනීම අත්‍යාවශ්‍ය වේ. ආයතනික පොත්හි සටහන්වන දැනුමෙහි ප්‍රභවයන් වන්නේ එක් අතකින් බහායි ධර්මයෙහි ඉගැන්වීම් සහ අනෙක් අතින් ලොවපුරාවූ බහායි සමාජය විසින් භෞතික සහ ආධ්‍යාත්මික ශිෂ්ඨාචාරය ගොඩනැඟීමෙන් ගුණනය වන අත්දැකීම් වලින්ද යුක්තවේ. එය අප සැම කෙනෙකුම පත්විය හැකිබවට වූ බහාඋල්ලා තුමාගේ දැක්ම මෙන්ම ආයතනය විසින් ගොඩනැඟීමට පොළඹවන ශිෂ්ඨාචාරයත්වේ. සියළුම සහභාගිවන්නන් පසුබිම් වලින් නිදහස්ව සියළුම පොත්වල හා ඒකකයකම දක්වා ඇති පරිදි මෙහි ඇති දැක්ම වටහා ගැනීමට යොමුවන ඇතැයි බලාපොරොත්තු වේ.

ලෝකයේ ආගම්වාදීන් සහ අදහස්මතධාරීන් පාක්ෂිකයින් දිනා ගැනීම සඳහා හැකි සැම දෙයක්ම යෙදවීමට බලාසිටින හෙයින් ධර්මය පිළිබඳ නුහුරු අයට රූහි ආයතනයේ අභිප්‍රාය පිළිබඳ හෘදයාංගම ගැටළු ඇති විය හැකි අතර සුලභවම "මාගේ ආගම වෙනස් කිරීමටද ඇරයුම් කරනවාද?'' හෝ "ආගමට එක්වීමට මට ආරාධනය කරනවාද?" යනාදි ගැටළු ඉදිරිපත්වීමේදී උපදේශකවරයාට අනුක්‍රමික පාඨමාලාවේ ඉහත දැක්වූ අරමුණු පැහැදිලි කරදීමට අවස්ථාවක් උදාවනු ඇත. බහායිවරුන් ස්වාභාවිකවම තමන්ගේ මිත්‍රයින් සමාජයට එක්වනු දැකීමට මහත් උනන්දුවක් දැක්වුවත් අන්‍යාගම්කරනයට දායකවීම ඔවුන්ගේම ඉගැන්වීම් මඟින් අත්හිටුවා ඇති බව උපදේශකවරයා විසින් සඳහන්කිරීමට කැමැති වනු ඇත. ආයතනික පාඨමාලාවන් මඟින් ඇති කරනු ලැබූ සේවා මාර්ගයෙහි ගමන් කිරීම සහ බහාඋල්ලා තුමාගේ ඉගැන්වීම් අවබෝධ කරගැනීම නිරන්තරව ගැඹුරු කිරීමට යොමුකිරීම අධ්‍යන කට්ටලය පැහැදිලිවම උත්සාහ කර ඇතිමුත් පිළිගැනීම සහ ආගම සැම තනිපුද්ගලයෙකු විසින් නිදහස්ව සහ කිසිදු බලපෑමකින් තොරව සිදුවිය යුතු කරුණකි.

පුදුමයකින් තොරව මෙය අවබෝධ කරගැනීමේ ගැටළුවක් වන අතර, අනුක්‍රමයේ සියළු පොත් අතරින් ප්‍රමුඛ වන මෙය ආරම්භ කරනු ලබන පළමුවැන්නයි. ශුද්ධවූ ලේඛන කියවීම පුද්ගලයෙකු තම ජීවිතයේදී පිටු දහස් ගණනක් කියවීම හා සම කළ නොහැකි වන අතර “බහායි ලේඛන අවබෝධ කරගැනීම” නම්වූ ඒකකයේදී, දිනපතා ශුද්ධවූ ලේඛනයන්ගෙන් පාඨයක් කියවීමේ සහ එහි අර්ථය පිළිබඳ මෙනෙහි කිරීමේ පුරුද්ද පෝෂ්‍ය කිරීමට බලාපොරොත්තු වන්නාසේම මෙම පුරුද්ද ඔවුන් සේවා මාර්ගයෙහි ගමන් කිරීමට එක්වීමේදී විශාල උපකාරයක් වනු ඇත. මෙම අධ්‍යනය තුළදී ඔවුන්ට මඟ පෙන්වීම සඳහා උපදේශකවරයා විසින් විෂය කරුණු පිළිබඳ වඩා පුළුල්වූ අදහස් ලබාදිය යුතුය.

බහායි ලේඛනයන්හි ගැඹුරු ආධ්‍යාත්මික සත්‍යයක් අන්තර්ගත වන අතර එහි අපරිමේය අර්ථය අවබෝධ කරගැනීම උසස් කරගැනීමට උත්සාහ කළත් අපට කිසිදු දිනක එහි නියත අවසානයකට ළඟාවිය නොහැකි බව දනිමු. පළමු වතාවට අප පාඨයක් කියවීමේදී එහි ක්ෂණික අර්ථය පිළිබඳ අවබෝධයක් අප වර්ධනය කරගන්නා අතර ඒකකයේ පළමු කොටස මෙය ආරම්භක ලක්ෂ්‍යයක් ලෙස ගනී. “ලෝකයේ ශුභ සිද්ධිය ළඟා කරගත හැක්කේ පවිත්‍ර, හොඳ ක්‍රියාවන් තුලින්, ප්‍රශංසනීය සහ විනීත හැසිරීම මඟිනි” යන උද්ධෘත පාඨය කියවීමෙන් පසු “ලෝකයේ ශුභ සිද්ධිය ළඟා කරගත හැක්කේ කෙසේද” යන ප්‍රශ්නය සහභාගිවන්නන්ගෙන් අසනු ලබන අතර බැලූ බැල්මට දක්වා ඇති ප්‍රශ්න සහ අභ්‍යාසයන් ඉතා සරළ ලෙස පෙනී යාහැක. නමුත් වසර ගණනාවක අත්දැකීම් මෙලෙස ආරම්භ කිරීමටවූ ආයතනයේ තීරණය නිවැරදි බව පෙන්වා දී ඇත. පාඨයේ ඇතුළත් සත්‍යයන් සොයාගැනීමට ඉක්මන්වීම තුළින් එහි අඩංගු පැහැදිලි අදහස නොපෙනීයාමට ඉඩ නොදීමට වගබලා ගත යුතු බව අප සැම සිහියේ තබාගත යුතුය. අවබෝධ කරගැනීමේ පළමු මට්ටමට අවධානය යොමු කිරීම කණ්ඩායම් සාකච්ඡාවන් සඳහා අත්‍යාවශ්‍ය බව ප්‍රත්‍යක්ෂව ඇති අතර එය අදහස්හි ඒකීභාවය ශක්තිමත් වන්නාසේම පෞද්ගලික මත දිව්‍යමය ඥානයෙන් අලෝකමත්වූ විට එය මහත් කැමැත්තෙන් අත්පත්කර ගනී.

පද්‍යයන්හි අඩංගු එක් වචනයක් පිළිබඳ දීර්ඝ සාකච්ඡාවන් සිදුකිරීම, බොහෝ පාඨයන්ගේ ක්ෂණික අර්ථය අවබෝධ කරගැනීමට සඳහා ප්‍රයෝජනවත් නොවන බව සැලකිල්ලෙහි තබා ගැනීම වැදගත්වේ. ඇතැම්විට කණ්ඩායමට වචනය තේරුම් ගැනීමට ශබ්දකෝෂය භාවිතා කිරීමටද අවශ්‍යවන බව කිව හැක. කෙසේවෙතත් වචනයෙහි තේරුම සම්පූර්ණ වාක්‍යයෙහි සහ ඡේදයට අනුව නිගමනය කිරීමට සහභාගිවන්නන් ඉගෙනගැනීම වඩා ප්‍රයෝජනවත් වනු ඇත.

විෂයෙහි ක්ෂණික අර්ථයෙන් ඔබ්බට යන අවබෝධයක් ලබාගැනීම සඳහා අදහස්හි ප්‍රත්‍යක්ෂ ප්‍රකාශනයන් වෙත යොමුවන උදාහරණයන් ලබාදීම උපකාරී වන ඇත. මේ සම්බන්ධයෙන් සකස් කර ඇති සියළුම අභ්‍යාසයන් සරලය. දෙවන කොටසේදී උදාහරණයක් ලෙස සහභාගිවන්නන් කියවා අවසන් කරන ලද පාඨයක් තුළින් ඇතැම් ලක්ෂණයන් ප්‍රශංසනීය යැයිද නිගමනය කරන ලෙස ඔවුන්ගෙන් අසනු ලබයි. මෙිහා සමාන අභ්‍යාසයන් ඇති හතරවන කොටසෙහිදී, ගුණාංග පහක් නම් කරන ලෙසත් ලේඛනය මඟින් විස්තර කරන පරිදි “සියළුම මානුෂීය සදාචාරයන්ගේ පදනම” වන සත්‍යවාදී බවෙන් තොරව එයින් එකක් හෝ අත්පත් කරගැනීමට හැකිදැයි තීරණය කරන ලෙස උනන්දු කරනු ලබයි.

මෙහි අරමුණු සාක්ෂාත් කරගැනීමට පාඨයන් මගින් ඉදිරිපත් කර ඇති සමහර ව්‍යංග්‍යාත්වයන් පිළිබඳ සිතා බලන ලෙස සහභාගිවන්නන්ට අභියෝග කිරීම මඟින් අවබෝධකරගැනීම තවදුරටත් වර්ධනය කරගැනීමේ අවශ්‍යතාව මෙම ඒකකයෙන් සිදු කරයි. දෙවන කොටසේදී, “ලෝකයේ සිටින්නේ හොඳ මිනිසුන් ඉතා ටික දෙනෙකු බැවින් ඔවුන්ගේ කටයුතු වලින් කිසිදු ප්‍රතිඵලයක් සිදුනොවේ.” යන කියමන සත්‍යදැයි තීරණය කරන ලෙස දක්වනු ඇත. මෙහිදී හුදු නිගමනයන් ඉදිරිපත් කිරීමක් බලපොරොත්තු නොවේ. උපදේශකවරයා විසින් මදක් නවතා සහභාගිවන්නන්ගේ පිළිතුරු සඳහාවූ හේතූන් පිළිබඳ විමසා සිටිය යුතුවේ. පසුගිය කොටසෙහි පළමු පාඨයට විරුද්ධ අදහස් ඇති හෙයින් මෙම ප්‍රකාශ පැහැදිලිවම නිවැරදි නොවන බවටවූ නිගමනයට කණ්ඩායම පැමිණිය යුතුය. බහායිවරුන් තමන්ගේ වැරදි අන්යට පාපොච්චාරණය කළයුතුද යන්න වූ ගැටළුවද මෙිහා සමාන කාර්යයකට උදාහරණයක් වේ. අධ්‍යනය කරන ලද කිසිදු පාඨයක විශේෂයෙන් සඳහන් කල නොමැති වුවත් “විගණනයට කැඳවීමට කලින් තමන් අතින් එදිනෙදා කෙරුණු කර්ම ගැන දිනපතා සිතා බලන්න” යන උද්ධෘත පාඨයේ අර්ථය පිළිබඳ ගැඹුරින් අවධානය යොමු කිරීමෙන් පව් ක්ෂමා කරගැනීමේ මාර්ගයක් ලෙස පාපොච්චාරණය කිරීම ඉගැන්වීම්වලට පටහැනි බව සඳහන් කළහැක.

පාඨයන්හි ගැඹුරු ලෙස දක්වා ඇති අර්ථන්හි කෙරෙහි බොහෝසේ අවධනාය යොමු කිරීමට උත්සාහ ගනිමින් අභ්‍යාසයන් සිදු කිරීම ප්‍රයෝජනවත් නොවේ. සපයා ඇති ඕනෑම අභ්‍යාසයක් පිළිබඳ කෙතරම් දුරටක සාකච්ඡා සිදු කල යුතුදැයි උපදේශකවරයා විසින් අරමුණු කරගත යුතුය. මෙහිදී අප සිත්හි තබාගත යුතු වැදගත් කාරණයක්නම් පාඨය හා සබැඳි බොහෝ දෑ නමුත් නොවැදගත් සංකල්පයන්

හඳුන්වාදීමට සිදු කරන දීර්ඝ විචාරණයන් අධ්‍යනයේ කාර්යයසාධනය හීනවීමට බලපානු ඇත. සෑම කණ්ඩායමක්ම සෑහෙන ප්‍රමාණයේ ප්‍රගතියේ රිද්මයක් ඇති කරගත යුත අතර සහභාගිවන්නන් ඔවුන්ගේම ශක්‍යතාවයන්ට අනුකූලව නොනැවතී ප්‍රගතියට පත්වන බවටවූ පැහැදිලි හැඟීමක් ඔවුන් තුල ඇති විය යුතුය. කෙසේවෙතත් මෙහෙදී උපදේශකවරයා විසින් අභ්‍යාසයනනනන්ගේ දක්වා ඇති ගැඹුරු විග්‍රහයන් පිළිබඳ අවබෝධයක් නොගෙන අදාල කොටස් වේගයෙන් සිදු නොකිරීමට වගබලා ගත යුතු අතර එලෙස පවත්වාගෙන යන කණ්ඩායම් හුදෙක් පිළිතුරු සැපයීමක් පමණක් සිදු කරන අතර කිසි දිනක අවසාන ප්‍රතිඵලය වෙත ළඟා නොවෙති.

අවසානයට තවත් එක් අදහසක් සඳහන් කිරීම යෝග්‍ය වන අතර එනම් අධ්‍යනය මඟින් පෝෂ්‍ය කරන ඉගෙනගැනීමේ ක්‍රියාවලියට කණ්ඩායමේ සෑම සහභාගිවන්නෙකුව යොමුව සිටින බව සහතික කිරීම උපදේශකවරයෙකු මත පැවරෙන කටයුත්තකි. කිසිදු තනිපුද්ගලයෙකුට බලපෑමක් සිදු නොකර සහභාගිවන්නන් සාකච්ඡාවට යොමු කරගැනීම බොහෝවිට අභියෝගයක්විය හැක. මෙම අභියෝගයේ ආරම්භය ලෙස අවබෝධ කරගෙන ඇත්තේ ඉඳහිට සහභාගිවන්නනන්ගෙන් "මෙයින් ඔබට හැඟී යන්නේ කුමක්ද?" වැනි ප්‍රශ්න ඇසීමත්, එවැනි ප්‍රශ්න මඟින් සත්‍ය සහ දැනුම අදහස් දැක්වීමේ මට්ටමට දක්වා පහත යෑමට හේතුවන බවයි. එලෙසම මෙවැනි ක්‍රියාවන් නිසා කණ්ඩායමේ සාමාජිකයින් සමඟ අවබෝධ කරගැනීම වර්ධනය කල හැකි සාකච්ඡාවන් සිදු කිරීමේ වාතාවරණයක් ඇති කිරීමට දුෂ්කර වන බව පෙන්වාදී ඇත.

දෙවන ඒකකයද පළමු ඒකකය මෙන් ආධ්‍යාත්මික ජීවිතයේ අත්‍යාවශ්‍ය පුරුද්දක් වන නිරන්තර යාඥා සිදු කිරීම කෙරෙහි යොමුව ඇත. ආරම්භක ඒකකයේදී "සේවා මාර්ගය" යන සංකල්පය ඉතා පැහැදිව විස්තර කර ඇති අතරම මෙම මාර්ගයෙහි ගමන් කිරීමට එක්ව බැඳුනු ද්විත්ව අරමුණු අපගේ සිත් තුලට තදින් කාවද්දා ගතයුතු බව සඳහන් කරයි. සහභාගිවන්නන් අධ්‍යනය කරන ආරම්භක පාඨයන් කට්ටලයන්හිදී මෙම අරමුණුවල ස්වභාවය පිළිබඳ දර්ශනයක් ලබාදෙන අතරම එම මාතෘකා ඉදිරි පාඨමාලාවන්හිදී විස්තරාත්මක විග්‍රහක් සිදු කරයි.

මෙම මාතෘකාවන්ගේ පසුබිම මත පිහිටන ලෙස මෙම ඒකකය විසින් යාඥාවේ වැදගත්කම පිළිබඳ ගවේෂණයක් සිදු කරයි. එමඟින් ඉහත ඡේදයන්ගේ විස්තරයට සමාන ප්‍රවේශයක් ලබාගැනීම සිදු කරයි. පාඨයන්ගේ අධ්‍යනය කරනු ලබන ලේඛනයන් අර්ථය පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම සඳහා එහි ප්‍රශ්න සහ අභ්‍යාසයන් සකස් කර ඇත. කණ්ඩායම ඒකකයේ තුල යනු ලබන ප්‍රගතියත් සමඟ අතීත පුරුදු සහ අර්ථවිවරණයන් කෙරෙහි මුල්බැස ඇති හැඟීම් විශ්ලේෂණයෙන් සැකයන් දුරු කිරීමට උපදේශකවරයා විසින් සිදු කිරීම අවශ්‍ය වනු ඇත. ඇතැම් සම්ප්‍රදායන්වලදී පිළිවෙත් සහ චාරිත්‍රයන් අභ්‍යන්තරික තත්වයන්ගේ වැදගත්කම මඟින් ක්‍රමාණුකූලව යටපත් වන අතරම බොහෝමයක් යාඥාවේ ඇති වැදගත්කම නොසලකා හරිනමුත් එය, මනුෂ්‍ය ශරීරය පෝෂණය කිරීමට ආහාරවල අත්‍යවශ්‍යතාවයට නොඅඩු මනුෂ්‍ය ආත්මය සඳහා ඉතා තීරණාත්මක අවශ්‍යතාවයකි.

සියල්ලට ඉහළින් "දෙවියන්වහන්සේ සමඟ කතාබව කිරීම" සහ උන්වහන්සේ වෙතට ළඟාවීමට සහභාගිවන්නන්ගේ ඇති අපේක්ෂාව අවදි කිරීම මෙම ඒකකයේ අපේක්ෂාවයි. අප තනිව හෝ රැස්වීමකට එක්ව සිටියද යාඥා කිරීමේ තත්වයට පැමිණීම යන්නෙහි අර්ථය කුමක්ද, යාඥා කිරීමේදී අපගේ හදවත සහ මනස තිබිය යුතු ඉරියව්ව, අපගේ වටපිටාව සුදානම් කළ යුතු තත්වය යනාදිය සාකච්ඡා කළ යුතු කරුණු අතරවේ. සහතිකවශයෙන්ම, සාමුහික වන්දානමාන කිරීම මඟින් ජනිතවන බලවේගයනන්ට අදහස් කිහිපයක් ලබාදීමෙන් පසු යාඥා කිරීමට සහ ඇදහීම් සඳහා රැස්වීමක් පැවැත්වීමට යොමුවන ලෙස සහභාගිවන්නන්ගෙන් අසනු ලැබේ.

මෙම පොතෙහි තුන්වන ඒකකය වන "ජීවිතය සසහ මරණය" අධ්‍යනයේදී වඩා හෘදයාංගම අර්ථයකින් යුක්තව සේවා මාර්ගයේ ගමන්කිරීමට යොමුවීම ශක්තිමත් කිරීමට බලාපොරොත්තුවේ. මේ ලෝකය තුළ සේවය කිරීම යනු ජීවිතයේ යථාර්ථය අවබෝධ කරගත හැකි හොඳම මාර්ගය වන අතරම එය අපගේ භෞතික පැවැත්මෙන් ඔබ්බට ගොස් දෙවියන්වහන්සේගේ ලෝකය තුළ අපගේ ආත්ම ප්‍රගතියත් සමඟ ඉදිරියට යනු ඇත. තාක්ෂණික පුහුණුවට වඩා වෙනස් වූ අධ්‍යන ක්‍රියාවලිකදී සහභාගිවන්නන් ඔවුන් සිදු කරන්නේ කුමක්දැයි යන්නෙහි අර්ථය සහ සුවිශේෂිත්වය පිළිබඳ වර්ධනය වන සචේතනික දැනුමකට පත්විය යුතය. අත්දැකීම් මඟින් පෙන්වා දෙන පරිදි සහභාගිවන්නන් ඔවුන් ඔවුන්ගේම අධ්‍යනයේ ක්‍රියාකාරී සහ වගකියන "හිමිකරුවන්" ලෙස දැකීමට හැකිවන්නේ මෙවැනි වර්ධනයවන සචේතනික දැනුමකින් පමණක් බවයි.

මේ ඒකකයේ සෑම කොටසක්ම එකේ සිට තුන දක්වාවූ සංඛ්‍යාවක බහාඋල්ලා ලේඛණ සහ ඒ හා සම්බන්ධ අභ්‍යාසයන්ගෙන් ආරම්භ වේ. පෙර ඒකක දෙකට සාපේක්ෂව මෙහි උපුටාගෙන ඇති පාඨයන්ගේ භාෂිතය වඩා අභියෝගාත්මක වනු ඇත. සහතිකවම දුෂ්කර වචනවල අර්ථ කෙරෙහි වැඩි කාලයක් යොමු කිරීම අවශ්‍ය නොවන අතර, අභ්‍යාසයන් තුළදී ලබාගැනීමට උත්සාහගෙන ඇති ආකාරයට සෑම කොටසකම කේන්ද්‍රීය අර්ථය සියලුදෙනාටම ග්‍රහණය කරගත් බවට සහතිකවීමට උපදේශකවරයා කටයුතු කල යුතුය.

ලාබදී ඇති විෂයෙහි ස්වභාව අනුව ප්‍රත්‍යක්ෂ උදාහරණ කිහිපයක් හෝ බොහෝමහයක් සම්බන්ධ කර ඇති අභ්‍යාසයන්ද ඇතුළත්ව ඇත. බොහෝවිට සෛද්ධාන්තික මට්ටමෙන් පවත්වාගෙන යාහැක. මෙහි යොදා ඇති ඇතැම් පාඨයන්ට ඉතා ඉක්මණින් හෝ පැහැදිලි ආකාරයෙන් පිළිතුරු සැපයිය නොහැකි බව මතකයේ තබගත යුතුය. ඒවා හඳුනවාදී ඇත්තේ විෂය පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම සඳහා වන අතර සහභාගිවන්නන් හුදෙක් එවැනි ප්‍රශ්න වෙත යොමුවන්නේ නම් අධ්‍යනය කිරීමේ පරමාර්ථය සම්පූර්ණ වේ.

මේ පැවැත්මේ ධරාතලය තුල මනුෂ්‍ය වර්ගයා බිහිකිරීමට එක්වන ආත්මය සහ ශරීරය අතර ඇති සම්බන්ධතාව පිළිබඳ කෙන්ද්‍ර කරගනමින් පළමු කොටස් කිහිපයක සකස්වී ඇත. මෙම කොටස් කිහිපයෙහි දක්වා ඇති ප්‍රමුඛ අදහස වන්නේ ආත්මය යනු භෞතික වස්තුවක් නොවන බවත් ශරීරය සමඟ එහි සම්බන්ධතාව කණ්ණාඩියක් මත ප්‍රකාශ වන ආලෝකයක හා සම කල හැකි බවයි. එහි මුහුණත දූවිලිවලින් ආවරණයවී තිබුණද, කාලයත් සමඟ කණ්ණාඩිය විනාශයට පත්වුවද ඒ කිසිවකින් ආලෝකයේ ශ්‍රේෂ්ඨත්වය බලපෑමක් ඇති නොවේ. මරණය යනු තත්වයේ සිදුවන වෙනසක් පමණක් බවත්, ආත්මය සහ ශරීරය අතර ඇති සම්බන්ධතාව බිඳිගියද ආත්මය එහි නිර්මාතෘවරයා කරා සදා ප්‍රගතියට ගමන් කරයි.

ඒකකය මීළඟට යොමුවන්නේ ජීවිතයේ අරමුණ පිළිබඳවූ ප්‍රශ්නය වෙතට වන අතර එනම් දෙවියන්වහන්සේ දැන හඳුනාගැනීමත් උන්වහන්සේ ඉදිරියට පැමිණීමත්ය. මෙහි සාකච්ඡාවන් මාතෘකා දෙකක් අතර පරිභ්‍රමණය වේ. පළමුවැන්න නම් මේ ලෝකය තුල අපගේ ජීවිතයේ අරමුණ පිළිබඳ වන අතර දෙවැන්න නම් මරණින් පසු ආත්මයේ  ගමන් මාර්ගය පිළිබඳවයි. ආත්මය යනු දෙවියන්වහන්සේගේ සළකුණක් වන අතර එයට උන්වහන්සේගේ සියලුම නාම සහ ගුණාංගයන් ප්‍රදර්ශනය කළ හැක. එහෙත් මනුෂ්‍ය වර්ගයා තුළ එවැනි ශක්තීන් අප්‍රකටව පවතින අතර දෙවියන්වහන්සේගේ ප්‍රකාශවීමකගේ උපකාරයෙන් පමණක් එය වර්ධනය කළ හැකි වන අතර එවැනි ශුද්ධවූ ආත්මභාවයන් කලින් කලට පැමිණ මනුෂ්‍ය වර්ගයාට මඟ පෙන්වනු ලබයි. උන්වහන්සේලා විසින් ලබාදී ඇති ආධ්‍යාත්මික අධ්‍යාපනය මඟින් අප තුළ සැඟවී ඇති වස්තූන් අනාවරණය කරගත හැක.

මරණින් පසු ආත්මයේ ගමන් මඟ පිළිබඳ සහභාගිවන්නන්ට මෙනෙහි කිරීමට ඉදිරිපත්වන අදහස් මාලාවන් අතර දෙවියන්වහන්සේට භක්තිමත්වූවන් සත්‍ය ප්‍රීතිය ලබාගනු ඇති බවත් තවද අප කිසිවකු අපගේ අවසානය කුමක්දැයි නොදන්නා නිසාවෙන් අප සෑම කෙනෙකුටම සමාව දියයුතු බවත් කිසිවෙකුට වඩා උසස් යැයි යන හැඟීම් ඇති කරනොගත යුතු වන්නාසේම මේ ලෝකයේදී මෙන්ම මීළඟ ලෝකයේදීත් අපගේ ආත්මයන් ප්‍රගතියට පත්වීම සිදුවන බවත් මේ ලෝකය තුලදී අප ගොඩනගාගත් ආධ්‍යාත්මික ගුණාංග එහිදී අපට ආධාර සහ උපකාර වනු ඇති අතර එමෙන්ම ඉහළ රාජධානියේදී අපගේ ආදරණීයයන් අප හඳුනාගන්නා අතර අප මේ ලෝකය තුළ ගත කළ ජීවිතය පිළබඳ සිහිපත් වන්නාසේම ශුද්ධවූ සහ පවිත්‍ර ආත්මයන්ගේ සමාගමයෙන් ප්‍රීතිමත් වනු ඇති වග යනාදිය වේ.

මීළඟ ලෝකයේදී අපට ලැබෙන ප්‍රතිලාභයන් පිළිබඳ සහතිකවන එසේම මේ ජීවිතයේ සිදුවනු වෙනස්කම් සහ අවස්ථාවන්ට අප කනස්සල්ලට පත්කිරීමට ඉඩ නොදීමට මහත්සේ උනන්දු කරවන බහාඋල්ලා තුමාගේ ලේඛන අඩංගු පාඨයකින් මෙම ඒකකයේ අවසානය සනිටුහන් කරයි. ඔවුන්ගේම ජීවිත සඳහා ඔවුන් ඉගෙනගත් දෑ සම්බන්ධවන්නේ කෙසේදැයි සමාලෝචනය කරන ලෙස  සහභාගිවන්නන්ගෙන් අසනු ලබයි.



# බහායි ලේඛන අවබෝධකර ගැනීම

## අරමුණ

දිනපතා ශුද්ධවූ ලේඛණයන්ගෙන් පාඨයක්
කියවීම සහ එහි අර්ථ පිළිබඳ සමාලෝචන කිරීමේ
පුරුද්ද ශක්තිමත් කිරීම

## 1 වන කොටස

මෙම ඒකකයේ අරමුණ වන්නේ දිනපතා ශුද්ධවූ ලේඛනයන්ගෙන් පාඨයන් කියවීමේ සහ එහි අර්ථය පිළිබඳ සමාලෝචනය කිරීමෙ පුරුද්ද වර්ධනය කර ශක්තිමත් කිරීමට උපකාරී වීමයි. ශුද්ධවූ ලේඛණ වලින් එක් ප්‍රකාශයක වාක්‍යයක් කියවා අසා ඇති ප්‍රශ්නයට පිළිතුර එම ප්‍රකාශනයමවන පිරිදි සකසන ලද සපයන සරල අභ්‍යාසයකින් මෙම ඒකකය ආරම්භවේ. මෙය කරගෙන යෑම පහසු බව හැඟී ගියද උපුටා ගෙන ඇති ප්‍රකාශනයේ අර්ථය පිළිබඳ මෙනෙහි කිරීමටත් පාඨය කටපාඩම් කිරීම මෙම අභ්‍යාසයන් උපකාරී වනු ඇත.

**"ලෝකයේ ශුභසිද්ධිය ලඟාකර ගත හැක්කේ පවිත්‍ර හොඳ ක්‍රියාවන් තුලින්, ප්‍රසංශනීය හා විනීත හැසිරීම මගිනි."**[1]

1. ලෝකයේ ශුභසිද්ධිය ලඟාකර ගත හැක්කේ කෙසේද? ______________________________

______________________________________________

______________________________________________

**"බහාගේ මිනිසුනි, වචනවලට වඩා ක්‍රියාවන් වෙනස් අයගේ අඩිපාරේ නොයෑමට ප්‍රවේසම්වන්න."**[2]

2. අප ගමන් නොකළ යුත්තේ කාගේ අඩිපාරේද? ______________________________

______________________________________________

______________________________________________

**"එම්බා සත්ව පුත්‍රය! විගණනයට කැඳවනු ලැබීමට කලින්, එදිනෙදා තමන් අතින් කෙරුණු කර්ම ගැන දිනපතා සලකා බලන්න..."**[3]

3. අප විගණනයට කැඳවනු ලැබීමට කලින් කල යුත්තේ කුමක්ද? ______________________________

______________________________________________

______________________________________________

**"කියන්න, සහෝදරවරුනි! වචන නොව ක්‍රියාවන් ඔබලාගේ භූෂණය වේවා."**[4]

4. අපගේ සතත්‍ය භූෂණය විය යුත්තේ කුමක්ද? ______________________________

______________________________________________

**"ශුද්ධවූ වචන සහ පවිත්‍ර, හොඳ ක්‍රියාවන් දිව්‍යමය මහිමයේ ස්වර්ගයට ආරෝහණය වෙයි."**[5]

5. ශුද්ධවූ වචන සහ පවිත්‍ර හොඳ ක්‍රියාවන් කරන්නේ කුමක්ද?______________________________

______________________________________________

______________________________________________

## 2 වන කොටස

ඔබ විසින් කියවන ලද උද්ධෘත පාඨය හා සම්බන්ධ අභ්‍යාසයන් කිහිපයක් පහතින් දැක්වේ. එම පාඨයන්ගේ සුවිශේෂිත්වය පිළිබඳ ඔබ කණ්ඩායම තුළදී තවදුටරත් සමාලෝචනය කිරීමට එම අභ්‍යාසයන්ගෙන් බලාපොරොත්තු වන අතරම ඒවා නිරායාසයෙන් සිදු නොකළ යුතුය. සෑම අභ්‍යාසයක් පිළිබඳව ඉතා ගැඹුරු සාකච්ඡාවන් සිදු කළ යුතුයැයි එයින් අදහස් නොකරයි. කෙසේවෙතත් දුෂ්කර අභ්‍යාසයන් වලදී ඔබගේ කණ්ඩායමේ උපදේශකවරයා විසින් ඒ පිළිබඳ ගැඹුරු විග්‍රහයක් සිදු කරමින් ඔබට උදව් වනවා ඇත.

1. ප්‍රශංසනීය යනුවෙන් අදහස් වනුයේ ප්‍රශංසාව හිමිවිය යුතු යම්කිසි ක්‍රියාවකි. ප්‍රශංසනීය වන්නේ පහත සඳහන් ඒවායින්කවර ඒවාද?

   ________හොඳ සේවකයෙකුවීම
   ________අනිකුත් අයට ගරුකිරීම
   ________ඉගෙනීමට ලැදිවීම
   ________බොරු කියන්නෙක්වීම
   ________අලසයෙක්වීම
   ________අනිකුත් අයට උපකාර කිරීම

2. ඔබ විගණනයට කැඳවනු ලැබීමට කලින් යන වාක්‍ය ඛණ්ඩයේ අදහස කුමක්ද? ____________________

   ________________________________________________________________

3. පහත සඳහන් ප්‍රකාශයන්ගෙන් නිවැරදි වන්නේ මොනවාද?

   ________ලෝකයේ සිටින්නේ හොඳ මිනිසුන් ඉතා ටික දෙනා බැවින් ඔවුන්ගේ ක්‍රියා වලින් ප්‍රතිඵලයක් අත් නොවේ.
   ________යම්කිසි දෙයක් අනිකුත් මිනිසුන්ගේ අදහස් හා එකඟවේනම් එය නිවැරදිය.
   ________යම්කිසි දෙයක් දෙවියන්වහන්සේගේ ඉගැන්වීම්වලට එකඟවේනම් එය නිවැරදිය.

4. පහත සඳහන් ඒවා පවිත්‍ර හොඳ ක්‍රියාවන් වන්නේ මොනවාද?

   ________ළමයින් රැකබලා ගැනීම හා ඔවුන්ට ඉගැන්වීම.
   ________සොරකම් කිරීම.
   ________අන් අයගේ දියුණුව උදෙසා යාඥා කිරීම.
   ________කරදරයකින් බේරීමට කුඩා බොරුවක් කීම.
   ________අන් අයට උදව් කර ඒ වෙනුවෙන් ත්‍යාගයක් පැතීම.

5. පහත සඳහන් කවරක් වචනවලට වඩා ක්‍රියාවන් වෙනස් පුද්ගලයෙකුගේ තත්වය හා ගැලපේද?

   ________යම්කිසි අයෙකු අප සැවොම ඒකීයභාවයෙන් සිටිය යුතු බව නිරන්තරව පැවසුවත් ගැටුම්කාරී තත්වයන් නිර්මාණය වන ලෙස හැසිරීම
   ________අයෙකු පවිත්‍ර ජීවිතයේ වටිනාකම පිළිබඳ වර්ණනා කරමින් සිටියද විවිහයෙන් පිටත ලිංගික සම්බන්ධකම් පැවැත්වීම.

________ මත්පැන් පානය තහනම පිළිබඳවූ ආගමික මහපෙන්වීම් පිලිපදින ලෙස ප්‍රකාශ කරන අයෙකු ඉදහිට මධ්‍යසාර භාවිතා කිරීම.

________ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවට පක්ෂපාතීව කටුයතු කරන අයෙකු, සේවායෝජකයෙකු ලෙස එකම රැකියාව කරන කාන්තාවයන්ට පුරුෂයෙකුට වඩා අඩුවෙන් වැටුප් ලබාදීම.

6. තවත් කෙනෙකුට පාපෝච්චාරණය කිරීමට බහායිවරයෙකුට අවසර තිබේද? ________________

7. පාපෝච්චාරණය කිරීම වෙනුවට ඔහුට හෝ ඇයට කුමක් කළ හැකිද? ________________

________________________________

8. "දිව්‍යමය මහිමයේ ස්වර්ගීය" යනුවෙන් අදහස්වන්නේ කුමක්ද? ________________

________________________________

9. නරක ක්‍රියාවන් නිසා ලෝකයට ඇතිවන බලපෑම කුමක්ද? ________________

________________________________

10. නරක ක්‍රියාවන් නිසා ඒවා කරන්නවුන් මත ඇතිවන බලපෑම කුමක්ද? ________________

________________________________

## 3 වන කොටස

ශුද්ධවූ ලේඛනයන්ගෙන් උපුටාගන්නා ලද පහත සඳහන් ප්‍රකාශයන් කියවා මෙනෙහි කරන්න. පසුව ඒවා කටපාඩම් කරගැනීමට උත්සාහ ගන්න.

**"සත්‍යවාදී බව සියළුම මානුෂික සදාචාරයන්ගේ පදනමයි"**[6]

1. සියළුම මානුෂික සදාචාරයන්ගේ පදනම කුමක්ද? ________________

________________________________

**"සත්‍යවාදී බවෙන් තොරව කිසිම ආත්මයකට දෙවියන්වහන්සේගේ ලෝක සියල්ලෙහිම ප්‍රගතිය සහ ජයග්‍රහණය ලබාගත නොහැක"**[7]

2. සත්‍යවාදී බවෙන් තොරව කළ නොහැක්කේ කුමක්ද? ________________

________________________________

**"මිනිසුනි, ඔබලාගේ දිව්වල් සත්‍යවාදී බවින් අලංකාරකර, ඔබලාගේ ආත්ම අවංක බව නමැති ආභරණයෙන් සරසන්න."**[8]

3. අපි අපේ දිව්වල් අලංකාර කළයුත්තේ කුමකින්ද? ________________

________________________________

4. අපි අපේ ආත්ම සැරසිය යුත්තේ කුමකින්ද? ______________________________

______________________________________________

**"ඔබගේ ඇස නිර්මල වේවා. ඔබගේ අත විශ්වාසදායක වේවා, ඔබගේ දිව සත්‍යවාදී වේවා, ඔබගේ හදවත ආලෝකමත් වේවා"**[9]

5. අපගේ ඇස කෙබඳුවිය යුතුද? __________ අපගේ අත? __________________
අපගේ දිව? __________________ අපගේ හදවත? __________________

**"දෙවියන්වහන්සේගේ මන්දිරයේ පදිංචිවී, සදාකාලික මහිමයේ ආසන මත තැන්පත්වී සිටින්නන් කුසගින්නේ මියයමින් සිටියද, ඔවුන්ගේ අත් දික්කර, තම අසල්වාසියා කොපමණ දුෂ්ඨ හා නොවටිනා අයෙක් වුවද, ඔහුගේ දේපල නීති විරුද්ධ අන්දමින් අල්වා ගැනීම ප්‍රතික්ෂේප කරනු ඇත."**[10]

6. අප කුසගින්නේ මිය යමින් සිටියද කිරීමට ප්‍රතික්ෂේප කළ යුත්තේ කුමක්ද? __________________

______________________________________________

______________________________________________

## 4 වන කොටස

සමහරක් අභ්‍යාසයන් සඳහා නිශ්චිත පිළිතුරු අවශ්‍ය බව ඔබ 2 වන කොටසේදී නිරීක්ෂණය කරන්නට ඇත. එවැනි අවස්ථාවන්හීදී, පිළිතුරු පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඔබගේ කණ්ඩායමේ උපදේශකවරයා විසින් ඔබටත් කණ්ඩායමේ ආනෙකුත් සහභාගිවන්නන්ද අදහස්හි එක්සත්බවට ළඟාවීමට උපකාර කළ හැක. අනෙකුත් අභ්‍යාසයන් සඳහා සාකච්ඡාව ඉතාම වැදගත්වන අතර අපේක්ෂිත පිලිතුරක් ලබාදිය හැක. පහත අභ්‍යාසයන්ගේ තුන්වැන්න මෙහි පළමු කාණ්ඩයට ඇතුළත් වන අතර 6 වැනි අභ්‍යාසය දෙවැනි කාණ්ඩයට අයත් වේ.

1 සත්‍යවාදී බව සියළුම මානුෂික සදාචාරයන්ගේ පදනමයි. සදාචාර පහක් නම් කරන්න. __________

______________________________________________

______________________________________________

2 සත්‍යවාදී බවෙන් තොරව අපට මේ සදාචාර ලබාගත හැකිද? __________________

3 පහත සඳහන් ප්‍රකාශයන්ගෙන් නිවැරදි කුමක්දැයි තීරනය කරන්න.

_____ කෙනෙක් බොරු කීවද ඔහුට යුක්ති සහගත විය හැකිය.

_____ සොරකම් කරන්නෙකුට විශ්වාසදායක අතක් තිබේ.

_____ විශ්වාසදායක අතක් කිසිවිටෙක එයට අයත් නොවන දෙයක් ස්පර්ශ නොකරයි.

_____ කාමුක චිත්‍ර සහිත පොත් සහ සඟරා කියවීම, නිර්මල ඇසක් ඇති කරගන්නා ලෙස බහාඋල්ලාතුමා දී ඇති උපදේශයට පටහැනිය.

_____ සත්‍යවාදී බව යන්නෙහි අදහස බොරු නොකීමයි.

_____ අවංකභාවය ආත්මයට ආභරණයකි.

_____ සත්‍යවාදී නොවන තැනැත්තෙකුට ආධ්‍යාත්මිකව ප්‍රගතියට යාහැක.

_____ ඉඳහිට බොරුවක් කීමේ වරදක් නැත

_____ කෙනෙක් කුසගින්නේ සිටිනම් සොරකම් කිරීම දෙවියන්වහන්සේ ඉදිරියේ පිළිගතහැක.

_____ කෙනෙකුගේ අවසරයක් නැතිව, පසුව එය ආපසු දෙන අදහසින් යමක් ගැනීම සොරකමක් නොවේ.

_____ අපි අවංකව කටයුතු කරනවිට හා නිර්දෝෂ හා සත්‍යවාදී වූවිට අපගේ හදවත් ආලෝකමත් වේ.

_____ සුළු හෝ වංචාවක් නොකර ව්‍යාපාරයක් දියුණු කළ නොහැක.

4 කෙනෙකුට තමන්ටම බොරු කියාගත හැකිද? ____________________

5 අපි බොරුවක් කීවිට අපට නැතිවන්නේ කුමක්ද? ____________________

6 අපි සියල්ලෝම සත්‍යවාදී හා අවංක නම් ලෝකය කෙබඳු ස්ථානයක් වේද? ____________________

## 5 වන කොටස

පහත සඳහන් උද්ධෘත පාඨයන් කියවා කටපාඩම් කරගැනීමට උත්සාහ කරන්න. ශුද්ධවූ ලේඛනයන්ගේ උද්ධෘත පාඨයන් කටපාඩම් කිරීමෙන් උසස් අගනා ප්‍රතිඵල ලබාදෙන බැවින් ඒ සඳහා ඔබගේ උපරිම උත්සාහය යොදන්න. සැබවින්ම සැම කෙනෙකුටම කටපාඩම් කිරීම ඉතා පහසුවෙන් කළ නොහැක. කෙසේවෙතත්, මුල් පාඨයට හැකිතාක් සමීප වචනලිවන් එය ප්‍රකාශ කිරීමට උත්සාහ කිරීම මහින් එහි අදහස අපගේ හදවතෙහි සහ මනසෙහි සනිටුහන් කරගැනීමට උපකාරීවවන ඇත.

**"කාරුණික දිවක් මිනිසුන්ගේ හදවත් ඇදගන්නා කාන්දම්ගලක් බඳුය. එය ආත්මයේ ආහාරය වන අතර වචන අර්ථයකින් සරසයි. එය ඥානාලෝකයේත් අවබෝධයේත් උල්පතයි"**[11]

1 කාරුණික දිවක් විස්තර කළ හැක්කේ කෙසේද? ____________________

____________________

____________________

____________________

2 කාරුණික දිවකින් වචන මත ඇති කරන ප්‍රතිඵලය කුමක්ද? ____________________

____________________

**"ස්වාමීන් වහන්සේගේ ආදරවන්තයනි! මේ ශුද්ධවූ ශාසනයෙහි ගැටීම් හා කලහයන්ට කොහෙත්ම ඉඩ නැත. සැම ආක්‍රමණිකයෙකුටම දෙවියන්වහන්සේගේ අනුග්‍රහය අහිමිවේ."**[12]

3 මේ ඡේදයට අනුව මේ ශාසනයෙහි අවසර නැත්තේ කුමකටද? ____________________

____________________

4 ආක්‍රමණිකයා තමාටම කරගන්නේ කුමක්ද? ____________________

____________________

**"දෙවියන්වහන්සේගේ ආදරණීයයන් අතර භේද සහ ආරවුල්, කලහ, දබර සහ නොසැලකිල්ල තරම් මෙදවස ධර්මයට හානි කරවූ අන්කිසිවක් නැත."[13]**

5 දේව ධර්මයට විශාලතම හානිය සිදු කරන්නේ කවර තත්වයන්ද? ____________________

____________________

____________________

**"වචන වලින් පමණක් මිත්‍රත්වය පෙන්වීමෙන් සෑහීමකට පත් නොවන්න, ඔබට මුණ ගැසෙන සියළු දෙනාම වෙනුවෙන් ඔබගේ හදවත ආදර කරුණාවෙන් දැවෙන්නට සලස්වන්න."[14]**

6 අප සතුටට පත් නොවිය යුත්තේ කුමන අන්දමේ මිත්‍රත්වයකින්ද? ____________________

____________________

7 අපගේ හද තුල දීප්තිමත්ව ඇවිලිය යුත්තේ කුමක්ද? ____________________

____________________

**"යුද්ධය පිළිබඳ අදහසක් පැමිණිවිට ඊට වඩා ශක්තිමත් සාමය පිළිබඳ සිතුවිල්ලකින් එය වලකාලන්න, වෛරය පිළිබඳ සිතුවිල්ලක් ඊට වඩා බලවත් ප්‍රේමය පිළිබඳ සිතුවිල්ලකින් විනාශ කරදැමිය යුතුයි."[15]**

8 යුද්ධය පිළිබඳ සිතුවිල්ලක් වැළැක්විය යුත්තේ කුමකින්ද? ____________________

____________________

9 වෛරය පිළිබඳ සිතුවිල්ලක් විනාශ කළයුත්තේ කුමකින්ද? ____________________

____________________

## 6 වන කොටස

ඉහත උද්ධෘත පාඨය සිත්හි තබාගෙන පහත අභ්‍යාසයන් සිදු කරන්න.

1 'කාන්දම්ගල' යනු ආකර්ෂණයට කියන තවත් නමකි. කාරුණික දිවක් කාන්දම් ගලක් සේ ක්‍රියාකරන්නේ කවර අන්දමින්ද? ____________________

2 කාරුණික දිවකින් පහත සඳහන් වාක්‍ය ඛණ්ඩ නිකුත්වේදැයි තීරණය කරන්න.

_____ මට කරදර කරන්න එපා.

_____ ඇයි ඔබ මෙය තේරුම් නොගන්නේ

_____ කරුණාකර ටිකක් නවතින්නට පුළුවන්ද?

_____ මොනතරම් භයානක ළමයින්ද?

_____ ස්තුතියි, ඔබ හරි කාරුණිකයි.

_____ මට ඔබ වෙනුවෙන් වැය කරන්න කාලයක් නෑ. මම කාර්යය බහුලයි.

3 පහත සඳහන් කුමන තත්වයන්ගෙන් ගැටුම් සහ කලහයක් ඉදිරිපත් වේදැයි තීරණය කරන්න.

_____ දෙදෙනෙක් සාකච්ඡාවක් තුළදී එකම කාරණය පිළිබඳ ප්‍රතිවිරුද්ධ අදහස් ඉදිරිපත් කිරීම.

_____ සාකච්ඡාවක් තුළදී දෙදෙනකු එකිනෙකා සමඟ අමනාපවී විවාද කරගැනීම.

_____ දෙදෙනක් එකිනෙකා සමඟ කතා නොකර සිටින හෙයින් සතිපතා පැවැත්වෙන ආධ්‍යාත්මික මෙහෙයන් සඳහා සහභාගි නොවීම.

_____ ව්‍යාපෘතියක් සඳහා සහයෝගය දෙන කණ්ඩායමක සමාජිකයින් එකිනෙකා අනෙක් අය තමන් පැවරූ කාර්යය ඉටු නොකරන බවට චෝදනා කරගැනීම.

4 භේදය පිළිබඳ ලක්ෂණයන් පෙන්නුම් කරන්නේ පහත සඳහන් කවර තත්වයකදීද?

_____ මිත්‍රයින් දෙනෙක් මාර්ගයේදී එකිනෙකා පසුකර ගියද නොසලකා හැර සිටීම.

_____ කෙනෙකු අධ්‍යාත්මික රැස්වීමක් සඳහා පැමිණිවිට සියලු දෙනා ඇයව උණුසුම්ව පිළිගැනීම.

_____ සෑම කෙනෙකුම එකිනෙකාට ආචාරසම්පන්න වුවද, කණ්ඩායමක දෙදෙනෙක් එකම ව්‍යාපෘතියක සේවය කිරීමට පසුබටවෙති.

5 පහත සඳහන් ප්‍රකාශයන්ගෙන් නිවැදිදැයි තීරණය කරන්න.

_____ අන්අයගේ හදවත්වලට වේදනාගෙන දුන්නද, ඔවුන් ගැන තම සිතතුල ඇති අදහස් නොවලහා කිවයුතුයි.

_____ ගැටුමක් වැළැක්වීම සඳහා බොරුකීම නිවැරදිය

_____ ප්‍රේමයෙන් සහ කාරුණිකත්වයෙන් ගැටුමක් මැඩපැවැත් විය හැකිය.

_____ ප්‍රේමයෙන් යුක්තව කීවිට වචනවල ප්‍රතිඵල වැඩිය.

_____ කෙනෙකු රණ්ඩුසරුවල් කිරීම ආරම්භ කළේ නම් ඔහු සමඟ සටන් කිරීම නිවැරදිය.

_____ අසනීපයෙන් හෝ කණගාටුවෙන් සිටින අයෙකුට අනිත් අයට නපුරුවීමට අයිතියක් තිබේ.

_____ අන් අය යම් වැරැද්දක් කරනවිට ඔවුන්ට සිනාසීම කාරුණික නොවේ.

_____ නොමනාපකම් පවතිනවිට, එකිනෙකා අනෙකාට වැඩියෙන් ළංවීමට විශේෂ උත්සාහයක කළයුතුය.

_____ මිත්‍රයින් අතර නොමනාපකම් පවතිනවිට, එකිනෙකා අනෙකා ලංවීමට උත්සාහ කරනතුරු බලා සිටිය යුතුයි.

## 7 වන කොටස

පහත සඳහන් වාක්‍ය කියවා කටපාඩම් කරගන්න.

**"කේළාම්කීම හදවතේ ආලෝකය නිවාලන අතරම ආත්මයේ ජීවිතය නිවා දමයි"**[16]

**"ඔබත් පව්කරන්නෙක්ව සිටින තුරු අනිකුත් අයගේ පව්ගැන කථා නොකරන්න."**[17]

**"ඔබට නපුරක් කියනු ලැබීමෙන් වැළකෙනු සඳහා නපුරක් කථා නොකරන්න. ඔබගේ වැරදි විශාලවී පෙනීමෙන් වැළකීම සඳහා අනෙක් අයගේ වැරදි මහත්කොට නොදක්වන්න."**[18]

**"එම්බා සත්වපුත්‍රය! ඔබගේම වැරදි අමතක කරදමා අනිකුත් අයගේ වැරදි දැකීමෙහි ඔබ නිරත වනුයේ ඇයි?"**[19]

1 කේලාම් කීමෙන් එය කියන තැනැත්තා මත ඇතිවන බලෑම කුමක්ද? ____________________

____________________________________________

2 අනිකුත් අයගේ පව්ගැන කතා කිරීමට පළමු අප සිතිය යුත්තේ කුමක්ද? ____________________

____________________________________________

3 අනිකුත් අයගේ වැරදි විශාලකර දැක්වුවහොත් අපට සිදුවන්නේ කුමක්ද? ____________________

____________________________________________

4 අපි අනිකුත් අයගේ වැරදි ගැන සිතනවිට මතක තබාගත යුත්තේ කුමක්ද? ____________________

____________________________________________

## 8 වන කොටස

පාඨය සිත්හි තබාගෙන පහත අභ්‍යාසයන් සිදු කරන්න.

1 වෙනත් පුද්ගලයින්ගේ වැරදි සොයන පුද්ගලයෙකුගේ ආත්මයේ ප්‍රගතියට සිදුවන්නේ කුමක්ද? ________

____________________________________________

2 කේලාම්කීම සමාජයට බලපාන්නේ කෙසේද? ____________________

____________________________________________

3 ඔබගේ මිත්‍රයෙක් වෙනත් පුද්ගලයෙකුගේ වැරදි ගැන කථා කිරීමට පටන්ගත්විට ඔබ කරන්නේ කුමක්ද?

____________________________________________

4 පහත සඳහන් ප්‍රකාශයන් නිවැරදිදැයි තීරණය කරන්න.

_____ කෙනෙකුගේ සැබෑ වැරදි ගැන කථා කිරීම කේලාම්කීමේ ගණයට නොවැටේ.

_____ කෙනෙකුගේ හොඳ දේවල් සහ නරක දේවල් යන දෙකම එකවර කථා කිරීම කේලාම් කීමක් නොවේ.

_____ කේලාම්කීම අප සමාජයේ සිරිතක් වී තිබේ. එය වැලැක්වීම සඳහා අවශ්‍ය විනය ඇතිකරගත යුතුයි.

_____ අසන්නා අපි වෙනත් අයෙක් පිළිබඳව කියන දේ නැවත නොකීමට පොරොන්දුවේ නම් කේලාම්කීමේ වරදක් නැත.

_____ කේලාම්කීම, ඒකීයභාවයේ බරපතලම සතුරෙකි.

_____ අපි මුළු කාලය තුලම අන්අය ගැන කථා කිරීමේ පුරුද්ද ඇති කරගතහොත් කේලාම්කීමට වැටීමේ අවදානම තිබේ.

_____ ප්‍රාදේශීය ආධ්‍යාත්මික මණ්ඩල රැස්වීමකදී, කමිටුවක සාමාජිකයින් නම් කිරීම සඳහා එකිනෙක පුද්ගලයන්ගේ හැකියාවන් ගැන සාකච්ඡා කිරීම කේලාම් කීමකි.

_____ අපට කේලාම්කීමේ අවශ්‍යතාවයක් ඇතිවූවිට අපි අපගේම වැරදි ගැන කල්පනා කළයුතුයි.

_____ යමෙක් ධර්මයට හානිවන යමක් කරන බව දැනගත් විට අපි ඒබැව් සමාජයේ අනිකුත් සාමාජිකයින් සමඟ සාකච්ඡා කළ යුතුයි.

_____ යමෙක් ධර්මයට හානිකර යමක් කරන බව දැනගත් විට අප කළයුත්තේ ප්‍රාදේශීය ආධ්‍යාත්මික මණ්ඩලයට දැන්වීම පමණකි.

_____ විවාහක යුවලක් අතරේ රහස් නොතිබිය යුතු බැවින් අන්අයගේ වැරදි ගැන ඒ දෙදෙනා අතරේ සාකච්ඡා කිරීමේ වරදක් නැත.

## 9 වන කොටස

ආරම්භයේදී සඳහන් කළ පරිදි මෙම කොටසෙහි අරමුණ වන්නේ දිනපතා ශුද්ධවූ ලේඛණයන්ගෙන් පාඨයක් කියවීමේ සහ එහි අර්ථය පිළිබඳ මෙනෙහි කිරීමේ පුරුද්ද වර්ධනය කරගැනීමට සහ ශක්තිමත් කරගැනීමට සහභාගිවන්නන්ගේ ඇති උත්සාහය සඳහා උපකාරී වීමයි. බහාඋල්ලා තුමාගේ ඉගැන්වීම්වලට අනුව දෙවියන්වහන්සේගේ පද්‍යයන් දිනපතා උදෑසන සහ සවස කියවීම අපගේ ආධ්‍යාත්මික සංවර්ධනට උපකාරීවනු ඇත. මෙම වගකීම ඉෂ්ඨ කිරීම මඟින් අපට හිමිවන වරප්‍රදාසයන් පිළිබඳ පහත පාඨයෙන් දක්වා ඇති අතර, මෙය කටපාඩම් කරගන්නා ලෙස උනන්දු කර සිටිමු.

> **"මාගේ වචනය නැමැති සාගරයෙහි ඔබම කිමිදීමෙන් ඔබට එහි රහස් අනාවරණය කරගෙන, එහි පතුලෙහි තැන්පත්ව සැඟවී ඇති ඥානයේ මුතුඇට එළිදරව් කරගැනීමට හැකිවනවා ඇත."**[20]

මෙම කොටස සම්පූර්ණ කිරීමෙන් පසු බහාඋල්ලා තුමාගේ ලේඛණ අඩංගු පොතක් ලබාගෙන එය දිනපතා කියවීමට ඔබ කැමති වනවා ඇත. ගුප්ත වචන නමැති පොත පළමුවැන්න ලෙස හොඳ තෝරාගැනීමක් වේ.

## REFERENCES


1. Bahá’u’lláh, cited by Shoghi Effendi, *The Advent of Divine Justice* (Wilmette: Bahá’í Publishing Trust, 2006, 2018 printing), par. 39, pp. 36–37.
2. *Gleanings from the Writings of Bahá’u’lláh* (Wilmette: Bahá’í Publishing Trust, 1983, 2017 printing), CXXXIX, par. 8, p. 345.
3. Bahá’u’lláh, *The Hidden Words* (Wilmette: Bahá’í Publishing Trust, 2003, 2012 printing), Arabic no. 31, p. 11.
4. Ibid., Persian no. 5, p. 24.
5. Ibid., Persian no. 69, p. 46.
6. ‘Abdu’l-Bahá, cited by Shoghi Effendi, *The Advent of Divine Justice*, par. 40, p. 39.
7. Ibid.
8. *Gleanings from the Writings of Bahá’u’lláh*, CXXXVI, par. 6, p. 336.
9. *Tablets of Bahá’u’lláh Revealed after the Kitáb-i-Aqdas* (Wilmette: Bahá’í Publishing Trust, 1988, 2005 printing), no. 9.5, p. 138.
10. *Gleanings from the Writings of Bahá’u’lláh*, CXXXVII, par. 3, p. 338.
11. Ibid., CXXXII, par. 5, p. 327.
12. *Will and Testament of ‘Abdu’l-Bahá* (Wilmette: Bahá’í Publishing Trust, 1944, 2013 printing), p. 26.
13. *Gleanings from the Writings of Bahá’u’lláh*, V, par. 5, p. 8.
14. From a talk given on 16 and 17 October 1911, published in *Paris Talks: Addresses Given by ‘Abdu’l-Bahá in 1911* (Wilmette: Bahá’í Publishing, 2006, 2016 printing), no. 1.7, p. 6.
15. From a talk given by ‘Abdu’l-Bahá on 21 October 1911, ibid., no. 6.7, p. 22.
16. *Gleanings from the Writings of Bahá’u’lláh*, CXXV, par. 3, p. 300.
17. *The Hidden Words*, Arabic no. 27, p. 10.
18. Ibid., Persian no. 44, p. 37.
19. Ibid., Arabic no. 26, p. 10.
20. *Gleanings from the Writings of Bahá’u’lláh*, LXX, par. 2, p. 154.



# යාඥාව

## අරමුණ

යාඥාවේ වැදගත්කම පිළිබඳව සමාලෝචනය කිරීම සහ
දිනපතා යාඥා කිරීමේ පුරුද්ද ශක්තිමත් කිරීම.

# 1 වන කොටස

රුහි ආයතනයේ පාඨමාලාවන්ගෙන් බලාපොරොත්තු වන්නේ සහභාගිවන්නන්ට සේවා මාර්ගයේ ගමන් කිරීමට උපකාර කිරීමයි. අප මෙම මාර්ගයේ ගමන් කරන්නේ ආධ්‍යාත්මික සහ බුද්ධිමය වශයෙන් වර්ධනයවීම සහ සමාජ පරිවර්ථනයට දායකවීම යන අරමුණු ද්විත්වය පිළිබඳ අභිප්‍රායෙනි. අපගේ අරමුණෙහි මෙම අංගයන් ද්විත්වය එකිනෙකින් වෙන් කළ නොහැක. එක් උද්ධෘත පාඨයක බහාඋල්ලා තුමා මෙසේ අනුශාසනා කරයි:

**"ඔබලාගේ කටයුතු වලින් පමණක් කාර්යය බහුල නොවන්න; මනුෂ්‍ය වර්ගයා පුනරුත්ථාපනයට සහ සෞභාග්‍යයට පත්කිරීමටත් මිනිසුන්ගේ හදවත් සහ ආත්මයන් පවිත්‍ර කිරීමටත්, ඔබලගේ සිතුවිලි යොමු කරන්න"[1]**

වෙනත් උද්ධෘත පාඨයක, එතුමා මෙසේ පැහැදිලි කරයි:

**"... ලෞකික මනුෂ්‍යයාගේ අරමුණ විය යුත්තේ, සම්පූර්ණයෙන් හිස් කටයුතු වලින් මිදී, පැවැත්මේ රාජධානියට ඇතුල්වී, ලෝකයේ අභිවෘද්ධිය වෙනුවෙන් දායකවිය හැකි මෙන්ම සමඟියෙන් සහ එකමුතුකමින් එකිනෙකා සමඟ ජීවත්වීමට හැකිවන පරිදි කටයුතු කිරීමයි."[2]**

අපගේ අභ්‍යන්තර තත්වය සම්බන්ධයෙන්, එතුමන් ප්‍රකාශ කර සිටින්නේ:

**"පවිත්‍ර හදවතක් කණ්ණාඩියක් වැනිය; එය සත්‍ය හිරු සහ සදාතනික උදෑසනක අරුණෝදය ඒ මත බැබළවීමට හැකි පරිදි දෙවියන්වහන්සේ හැර අන් සියලුම දෙයින් වෙන්වී ප්‍රේමයේ දිස්නයෙන් පවිත්‍ර කරගත යුතුය."3**

එමෙන්ම අබ්දුල් බහාතුමා අපට පවසන්නේ:

**"දිව්‍යමය ප්‍රධානයන්ගේ ප්‍රතිලාභීන් විය හැකි පරිදි ඔබලාගේ හදවත් පවිත්‍රත්වයෙන් මෙන්ම අභිප්‍රායන් අව්‍යාජත්වයෙන්ද යුක්තවිය යුතුයි."[4]**

1. අපගේ සිතුවිලි වල සහ කටයුතුවල ඉලක්කය කුමක් විය යුතුද? ________________________________

______________________________________________________________________

______________________________________________________________________

2. සම්පූර්ණ හිස් කටයුතුවලින් මිදී, පැවැත්මේ රාජධානියට අප ඇතුල්වීමේ අරමුණ කුමක්ද? __________

______________________________________________________________________

______________________________________________________________________

______________________________________________________________________

3. අපගේ හදවත් නැමැති කණ්ණාඩිය පවිත්‍ර කරගත යුත්තේ කුමකින්ද? __________________________

______________________________________________________________________

4. දිව්‍යමය ප්‍රදානයන් ලැබීමට සුදුසුවන සමහරක් තත්වයන් මොනවාද? __________________________

______________________________________________________________________

5. පහත සඳහන් ඒවායින් සත්‍යවන්නේ මොනවාද?

- මුලින්ම තමා පිළිබඳ වගබලාගත් විට, පසුව අන් අයව වගබලා ගැනීමට හැකිය.
- ඔබලා සෑම අවස්ථාවකම අන් අයට උපකාර කරනවිට, ඔබගේම ඉලක්කය සිය දර්ශනයෙන් ගිලිහී යා හැක.
- තමාගේ සමීපතම මිතුරා වන්නේ තමාමවේ.
- වඩාත් වැදගත් වන්නේ, තමා සතුටින් සිටීමට අවශ්‍ය කුමක්දැයි දැනගැනීමයි.
- ඔබ සිහින හඹා යෑමෙන්, ඔබගේ සතුටට මාර්ගය විවෘත වේ.
- ඔබ තවත් කෙනෙකුට නොරිදවනතාක්කල්, ඔබ කරන්නේ කුමක්දැයි අදාළ නොවේ.
- ඔබ යහපත් ක්‍රියාවල නිරතවන තාක්කල්, ඔබගේ චේතනාව ආත්මාර්ථකාමී වුවාට කම්නැත.

## 2 වන කොටස

අපගේ ද්විත්ව අරමුණෙහි කේන්ද්‍රීය විශ්වාසය නම් අප සියළුදෙනාම නිර්මාණය කර ඇත්තේ උදාරත්වයෙනි. බහාඋල්ලා තුමා මෙසේ පවසයි:

**"එම්බා ආත්ම පුත්‍රය! මම ඔබ පොහොසත් කර මැව්මි, ඔබ දුප්පත් තත්වයට පහළ වැටෙනන්නේ ඇයි? මම ඔබ උදාර ලෙස තැනිමි, ඔබවම අවමානයට පත්වන්නේ ඇයි? දැනීමේ සාරයෙන් මම ඔබට ජීවය ලබාදුනි, ඔබ මා හැර අනෙකෙකුගෙන් ඥානය බලාපොරොත්තු වන්නේද? ප්‍රේමයේ මැටියෙන් මා ඔබ ඇඹුවෙමි, ඔබ අන් අයෙකු සමඟ කාර්යය බහුලව සිටින්නේ ඇයි? ප්‍රබල, ශක්තිධර හා ස්වාධීන වන මා ඔබ තුල ස්ථිරව සිටීම දැකගත හැකිවනු සඳහා, ඔබගේ දර්ශනය ඔබ තුලටම යොමු කරන්න."**[5]

පහත සඳහන් හිස්තැන් පිරවීමෙන් ඔබට උද්ධෘත පාඨය සමාලෝචනය කිරීමට උපකාර වන ඇත.

එම්බා ආත්ම පුත්‍රය! මම ඔබ ____________________ මැව්මි, ඔබ ____________________ පහළ ____________ ඇයි? මම ඔබ ________________ තැනිමි, ඔබවම ________________ පත්වන්නේ ඇයි? ______________________ මම ඔබට ජීවය ලබාදුනි, ඔබ ______________ අනෙකෙකුගෙන් __________________________ වන්නේද? ____________________ මැටියෙන් මා ඔබ ______________, ඔබ අන් අයෙකු සමඟ __________________________ සිටින්නේ ඇයි? _______, ______________ හා _____________ වන මා ඔබ තුල _______________ දැකගත හැකිවනු සඳහා, ඔබගේ ______________ ඔබ _________________ යොමු කරන්න.

අපගේ ආත්මයේ උදාරත්වයට සරිලන පරිදි, අපගේ පැවැත්මේ සාරය දෙසට යොමුවී ආලෝකය ලබාගැනීම සඳහා එතුමාණන් කරා යොමුවිය යුතුයි. මෙය මුදුන්පත් කර ගතහැකි ප්‍රබල මාර්ගය නම් යාඥාවේ මාර්ගයයි. ධර්මයේ ආරක්ෂකවරයාණන් වන, ෂෝගි එෆෙන්ඩි තුමා පවසන පරිදි එහි ප්‍රධාන අරමුණු "ආධ්‍යාත්මික ගුණාංග සහ බලයන් අත්පත් කරගැනීම තුලින්, තනි පුද්ගල මෙන්ම සමාජ සංවර්ධනයයි. එහිදී මුලින්ම මනුෂ්‍යාගේ ආත්මය පොෂණය කල යුතුයි. යාඥාව මඟින් මෙම ආධ්‍යාත්මික පෝෂණයන්ට මනාව දායකවිය හැක"[6]

## 3 වන කොටස

දෙවියන්වහන්සේ සියල්ල දන්නා සේක. සියළුම ප්‍රඥාවෙන් යුක්ත වන සේක. දෙවියන්වහන්සේ අපව නිර්මාණය කළ අතර අපගේ හදවත්වල ඇත්තේ කුමක්දැයි දන්නා අතරම අප සඳහා වඩාත්ම යෝග්‍යවන්නේ කුමක්දැයි දන්නා සේක. එතුමාණන්ට අපගේ යාඥාවන් අවශ්‍ය නොවේ. එසේ නම් අප යාඥා කළ යුත්තේ ඇයි?

අබ්දුල් බහාතුමා මෙසේ ප්‍රකාශ කරයි.

**"උසස්තම යාඥාවේදී මිනිසුන් යාඥා කරන්නේ දෙවියන්වහන්සේ කෙරෙහි හෝ අපාය කෙරෙහි ඇති බිය නිසා හෝ පරිත්‍යාග හෝ ස්වර්ගය බලාපොරොත්තුවෙන් හෝ නොව හුදෙක් උන්වහන්සේ කෙරෙහි ඇති ආදරය නිසා පමණි.... කෙනෙක් මනුෂ්‍යයෙක් සමඟ ප්‍රේමයෙන් වෙළුනු විට ඔහුට තම ආදරවන්තයාගේ නම සඳහන් නොකර සිටීම කළ නොහැකි වනු ඇත. කෙනෙක් දෙවියන්වහන්සේට ප්‍රේම කිරීමට පටන්ගත් විට උන්වහන්සේගේ නම සඳහන් නොකර සිටීම ඊටවඩා කොපමණ දුෂ්කර විය යුතුද?... ආධ්‍යාත්මික මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ අනුස්මරණයෙන් හැර අන්කිසිවකින් ප්‍රීතියට පත් නොවේ"[7]**

එසේම අසන ලද ප්‍රශ්නයකට පිළිතුරක් වශයෙන් එතුමා මෙසේ පැහැදිලි කරයි:

**"එක් මිත්‍රයෙක් තවත් මිත්‍රයෙකුට ආදරය කරයි නම්, ඔහු ඒ බව ප්‍රකාශ කිරීමට ආශා කිරීම ස්වාභාවික නොවේද? මිත්‍රයා තමාගේ ආදරය ගැන හොඳ හැටි දන්නා බව ඔහු දැන සිටියද, ඒ බව ඔහුට කියාපෑමට ඔහු ආශා නොකරන්නේද?... දෙවියන්වහන්සේ සෑම හදවතකම ඇති ආශාවන් දන්නා බව ඔහු දැන සිටියද, ඒ බව ඔහුට කියා පෑමට ඔහු ආශා නොකරන්නේද? දෙවියන්වහන්සේ සෑම හදවතකම ඇති ආශාවන් දන්නා බව සත්‍ය නමුදු, යාඥා කිරීමට පෙළඹීම දෙවියන්වහන්සේ කෙරෙහි මනුෂ්‍යයාගේ ඇති ආදරයෙන් හටගන්නා ස්වාභාවික එකක."[8]**

1. පහත සඳහන් වාක්‍යවල හිස්තැන් පිරවන්න.

   I. __________ යාඥාවේදී මිනිසුන් __________ දෙවියන්වහන්සේ කෙරෙහි හෝ ________ කෙරෙහි ඇති බිය නිසා හෝ __________ හෝ __________ බලාපොරොත්තුවෙන් හෝ නොව හුදෙක් උන්වහන්සේ කෙරෙහි ඇති __________ නිසා පමණි.

   II. කෙනෙක් මනුෂ්‍යයෙක් සමඟ________ වෙළුනු විට ඔහුට තම ____________නම __________ සිටීම __________ වනු ඇත. කෙනෙක් ____________________ පටන්ගත් විට උන්වහන්සේගේ නම ____________ සිටීම ඊටවඩා කොපමණ ________ විය යුතුද?

   III. ආධ්‍යාත්මික මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ ____________හැර අන්කිසිවකින් ________ පත් නොවේ.

2. අප යාඥා කළ යුත්තේ ඇයි? ________________________________________

   ________________________________________________________

3. 'දෙවියන්වහන්සේ ස්මරණය කිරීම' යන කියමනෙහි අර්ථය කුමක්ද? ____________________

   ________________________________________________________

4. තවත් කෙනෙකුට ආදරය කරන්නෙකුගේ ඉතා ළැදි ආශාව වන්නේ කුමක්ද? __________________

   ________________________________________________________

5. ආදරය තුළින් හටගන්නා ස්වාභාවික ක්‍රියාව කුමක්ද? ______________________________

   ________________________________________________________

## 4 වන කොටස

බහාඋල්ලා තුමා විසින් අනාවරණය කරන ලද යාඥාවකින් අප මෙසේ ඉගෙන ගනිමු.

**“ මාගේ යාඥාවෙන් ඔබවහන්සේගේ අලංකාරයෙන් මා වසා ඇත්තාවූ ආවරණයන් පුළුස්සා දැමිය හැක්කාවූ ගින්නක් හා ඔබවහන්සේගේ සමීපය නමැති සාගරය කරා මට මඟපෙන්වන්නාවූ ආලෝකයක් ඇති කර දෙන ලෙස ඉල්ලා සිටිමි.”**[9]

එම යාඥාවෙන්ම අප දෙවියන්වහන්සේගෙන් මෙසේ ඉල්ලා සිටිමු:

**“මාගේ ස්වාමීනි, ඔබ වහන්සේගේ ස්වාධිපත්‍ය පවතිනතාක් කල් මට ජීවත්වීමට හැකිකරවන ලෙසත්, ඔබවහන්සේගේ සෑම ලෝකයකදීම ඔබවහන්සේ පිළිබඳ සඳහන් කිරීමට හැකි කරවන ලෙසත් මාගේ යාඥාව ජීව ජලධාරාවක් කරන්න.”**[10]

1. යාඥාව ගින්නක් බඳුවිය හැක්කේ කෙසේද? එය පුළුස්සා දමන්නේ මොනවාද? ____________________

____________________________________________________________

2. දෙවියන්වහන්සේගෙන් අපව වසා තබන ආවරණයන් මොනවාද? ____________________

____________________________________________________________

____________________________________________________________

3. යාඥාවට ආලෝකයක් මෙන් විය හැකිද? එය අපට මඟපෙන්වන්නේ කුමක් කරාද? ______________

____________________________________________________________

____________________________________________________________

4. යාඥාවට ජීව ජලධාරාවක් මෙන් විය හැකිද? එය අපගේ ආත්මයන්ට ලබාදෙන පිරිනැමීම් මොනවාද? _

____________________________________________________________

____________________________________________________________

____________________________________________________________

## 5 වන කොටස

අබ්දුල් බහාතුමාගේ පහත සඳහන් වචන කියවා ඒ පිළිබඳ සමාලෝචනය කරන්න:

**“පවතින ලෝකයේ යාඥායට වඩා මිහිරි අන්කිසිවක් නැත. මනුෂ්‍යයා යාඥා පූර්වක තත්වයෙන් ජීවත්විය යුතුයි. ඉතාම ආශිර්වාදලත් තත්වයනම් යාඥා කිරීමේ තත්වය සහ ආයාචනා කිරීමේ තත්වයයි. යාඥා කිරීම යනු දෙවියන්වහන්සේ සමඟ සංවාදයේ යෙදීමයි. ශ්‍රේෂ්ඨතම ලබාගැනීම හෙවත් මිහිරිතම තත්වය අනෙකක් නොව දෙවියන්වහන්සේ සමඟ සංවාදයේ යෙදීමයි. එය ආධ්‍යාත්මිකත්වය ඇති කරන අතර සිහි කල්පනාව සහ දිව්‍යමය හැඟීම් ඇති කරවා රාජධානියේ නව ආකර්ෂණයන් ජනිත කර උසස් බුද්ධියේ නැඹුරුතාවයන් ඇති කරවයි.”**[11]

1. පවතින ලෝකයේ මිහිරිතම තත්වය කුමක්ද? ____________________

____________________________________________________________

2. යාඥා පූර්වක තත්වය යන ප්‍රකාශනයෙන් අදහස් වන්නේ කුමක්ද? ______________________________

______________________________________________________________

______________________________________________________________

3. යාඥාව තුලින් ඇති කරනු ලබන ගුණාංගයන් කිහිපයක් සඳහන් කරන්න. ______________________________

______________________________________________________________

______________________________________________________________

4. මෙම කොටස් කිහිපයේදී ඔබ විසින් අධ්‍යනය කරන ලද උද්ධෘත පාඨයන් නැවත මෙනෙහි කර යාඥාවේ ස්වභාවය පිළිබඳ වාක්‍ය කිහිපයක් නිර්මාණය කරන්න.

- යාඥාව යනු ______________________________________________
- යාඥාව යනු ______________________________________________
- යාඥාව යනු ______________________________________________
- යාඥාව යනු ______________________________________________
- යාඥාව යනු ______________________________________________

## 6 වන කොටස

බහාඋල්ලා තුමාගේ පහත සඳහන් වචන අධ්‍යනය කර ඒ පිළිබඳ මෙනෙහි කරන්න:

**"මාගේ සේවකය, ඔබට ලැබී ඇති දෙවියන්වහන්සේගේ පද්‍යයන් උන්වහන්සේට ඉතා සමීපවූ අයවළුන් විසින් ගායනා කර ඇති පරිදි ඔබගේ ස්වර මාධූර්යයේ මිහිරියාවෙන්, ඔබගේම ආත්මය ප්‍රබෝධමත්වී අනෙකුත් අයගේ හෘදයන් ආකර්ෂණය කරගනු වස් හඬනඟා ගයන්න. දෙවියන්වහන්සේ විසින් අනාවරණය කරන ලද පද්‍ය තම කාමරයට වී හුදකලාව ගයන කවරෙකු හෝ වේවා, සර්ව බලධාරීන්වහන්සේගේ විසිරී සිටින සුරදූතයෝ ඔහුගේ මුවින් නික්මෙන වචනවල සුභන්ධය අවට විසිරුවා සෑම යුක්ති ගරුක මිනිසකුගේම හෘදය ස්පන්දනයවීමට සලස්වනු ඇත. ඔහු මුලදී එහි ප්‍රතිඵලය ගැන අවබෝධයකින් සිටිය නොහැකි වුවද, ඔහුට පොරොන්දුවූ අනුග්‍රහයේ බලය වහාම හෝ ප්‍රමාදවී, ඔහුගේ ආත්මය මත බලපවත්වනු ඇත. මෙලෙස දෙවියන්වහන්සේගේ අනාවරණය පිළිබඳ අභිරහස් බලයේ සහ ප්‍රඥාවේ ප්‍රභවය වූ උන්වහන්සේගේ කැමැත්තේ බලයෙන් අණ කරනු ලැබ තිබේ."**[12]

1. 'හඬනඟා ගයන්න' යන වචනවල අර්ථය කුමක්ද? ______________________________

______________________________________________________________

2. අප දෙවියන්වහන්සේගේ පද්‍යයන් හඬනඟා ගායනය කළ යුත්තේ කෙසේද? ______________________________

______________________________________________________________

______________________________________________________________

______________________________________________________________

3. ‘ගායනා කරන්න’ යන්නෙහි තේරුම කුමක්ද? ____________________________________________

______________________________________________________________________

4. ‘අවට විසුරුවා’ යන වචනවල තේරුම කුමක්ද? __________________________________________

______________________________________________________________________

5. අපගේ ස්වර මාධූර්යයායේ මිහිරියාව අපගේ ආත්මය මත ඇති කරනු ලබන බලපෑම කුමක්ද? _________

______________________________________________________________________

6. අපගේ ස්වර මාධූර්යයායේ මිහිරියාව අන්අයගේ ආත්මයන් මත ඇති කරනු ලබන බලපෑම කුමක්ද? ____

______________________________________________________________________

______________________________________________________________________

## 7 වන කොටස

බහාඋල්ලා තුමා විසින් අනාවරණය කරන ලද පහත සඳහන් උද්ධෘත පාඨයන් කටපාඩම් කිරීමට ඔබ කැමති වනවා ඇත.

**“දෙවියනි, මාගේ දෙවියනි! මාගේ බලාපොරොත්තු හා මාගේ ක්‍රියාවන් ගැන නොසලකා පෘථිවිය සහ ස්වර්ගය වටලා ඇති ඔබවහන්සේගේ කැමැත්ත ගැන සැලකිලිමත් වන්න. සියළුම ජාතීන්ගේ ස්වාමීන්වූ ඔබවහන්සේගේ අතිශ්‍රේෂ්ඨ නාමයේ නාමයෙන්, මම ආශා කරන්නේ ඔබවහන්සේ ආශා කළ දෙයටත්, මම ආදරය කරන්නේ ඔබවහන්සේ ආදර කරන දෙයටත් පමණි.”**[13]

**“ඔබවහන්සේගේ සමීප බව නමැති ස්වර්ගය කරා අරෝහණයවීම සඳහා ඔබ අසලට පැමිණෙනෙන්නවුන්ගේ ප්‍රසංශාවට හෝ ඔබවහන්සේගේ ද්වාරය කරා ළඟාවීම සඳහා ඔබවහන්සේ කෙරෙහි භක්ත්‍යාදරය දක්වන්නවුන්ගේ හෘදයන් නමැති පක්ෂීන්ට ඔබවහන්සේ උසස් වැඩිය. ඔබවහන්සේ සියළුම ගුණාංගයන් අභිබවා පවිත්‍රත්වයට පත්ව ඇති බවටත් මම සාක්ෂි වෙමි. අතිඋත්කෘෂ්ඨ වූත්, සර්ව තේජස්වීවූත්, ඔබවහන්සේ හැර අන් දෙවි කෙනෙක් නැත”**[14]

## 8 වන කොටස

අබ්දුල් බහාතුමා මෙසේ සඳහන් කරයි:

**“දෙවියන්වහන්සේට යාඥා කිරීමත්, එතුමන්ගේ ආධාර ඉල්ලා සිටීමත් සේවකයෙකුට යෝග්‍ය වන අතර, එතුමාණන්ගෙන් අයැද සිටීම, බැගෑපත්ව ආයාචනා කර ආධාර පැතීමත් යෙදේ. දාසත්වයේ තත්වය එබඳුවන අතර, අධිපතියාණන් තමන්වහන්සේගේ අභිලාෂයට සහ පරිසමාප්ත ප්‍රඥාවට ගෝචරවන කුමක් හෝ නියම කරනු ඇත.”**[15]

එතුමාණන් මෙසේ විස්තර කරයි:

**“ආත්මයට බලපෑමක් තිබේ; යාඥාවෙන් ආධ්‍යාත්මික ප්‍රතිඵල ලැබේ. එම නිසා අප මෙසේ යාඥා කරමු, ‘අනේ දෙවියනි! මේ රෝගියා සුවපත් කරන්න!’ සමහරවිට දෙවියන්වහන්සේ පිළිතුරු දෙනු ඇත. යාඥා කරන්නේ කවුද යන්න වැදගත් වේද? යාඥාව හදිසි නම් සෑම සේවකයෙකුගේම යාඥාවට දෙවියන්වහන්සේ පිළිතුරු දෙනු ඇත. එතුමණ්ගේ අනුකම්පාව විශාල සහ අසීමිතය. උන්වහන්සේ සෑම සේවකයකුගේම යාඥාවන්ට පිළිතුරු දෙන සේක. එතුමාණන් මේ පැළැටියේ යාඥාවට පිළිතුරු දෙනු ඇත. පැළැටිය ප්‍රබල ලෙස මෙසේ යාඥා කරයි. ‘අනේ දෙවියනි මට වර්ෂාව එවන්න!’ දෙවියන්වහන්සේ එම යාඥාවට පිළිතුරු දෙන අතර, පැළැටිය වැඩේ. දෙවියන්වහන්සේ ඕනෑම කෙනෙකුට පිළිතුරු දෙනු ඇත.”**[16]

යාඥාවේදී අපගේ අවශ්‍යතාවයන් සපුරාදෙන ලෙස දෙවියන්වහන්සේගෙන් අප අයැද සිටීම ස්වාභාවික වේ. මෙලෙස, අපගේ මෙන්ම අප ආදරණීයනන්ගේ සෞඛ්‍ය සඳහා අප යාඥා කරන අතර, අපගේ පවුල්වල ආධ්‍යාත්මික සහ භෞතික සංවර්ධනය සඳහාද මඟ පෙන්වීම් ලැබීමටද අප යාඥා කරන්නෙමු. සේවා මාර්ගයේ ශක්තිමත්වීමටත්, භක්තිමත්භාවය සහ ස්ථිරසාරභාවය උදෙසා අප ආධාර ඉල්ලා සිටිමු. සැබැවින්ම, යාඥා කිරීමේ ඉලක්කය වියයුත්තේ අපගේ කැමැත්ත දෙවියන්වහන්සේගේ කැමැත්ත සමඟ එකතු කිරීම බව අප මතක තබාගත යුතුය. එමනිසා, දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටුවීමටත්, එයට අවනතවීමට හැකිකරවන ලෙස අප යාඥා කළ යුතුය. අබ්දුල් බහාතුමාගේ පහත සඳහන් වචන මතකයට නඟා ගැනීම, සෑම අවස්ථාවකදීම එමඟින් ඔබට ප්‍රීතියේ සහ සුරක්ෂිතභාවයේ ප්‍රභවයක් ගෙන එනු ඇත:

**"දෙවියන්වහන්සේ දෙසට සිය මුහුණ යොමා සිටින්නනි! ඔබගේ ඇස් අන්සියළුම දෙයට වසාගෙන, සර්ව කීර්තිමත් රාජධානිය දෙසට පමණක් යොමු කරන්න; ඔබ ප්‍රාර්ථනා කරන යමක් වෙතොත් එතුමාගෙන් පමණක් ඉල්ලා සිටිමින්, ඔබ සොයන දේ එතුමණ්ගෙන් පමණක් සොයා යන්න. එක බැල්මකින් එතුමණ් සිය දහස් ගණනක් අපේක්ෂාවන් ඉටු කරන අතර, එක් ක්ෂණික බැල්මකින් එතුමන් සුව කල නොහැකි අසනීපයන් සිය දහස් ගණනක් සුවපත් කරයිද, එක් හිස සැලීමකින් එතුමන් සෑම තුවාලයක් මතම ආලේපනයන් ගල්වයිද, එසේම එක් ක්ෂණික දර්ශනයකින් හදවත් ශෝකය නමැති විලංගුවලින්ද නිදහස් කරනවා ඇත. එතුමන් ක්‍රියා කරන අන්දමට ක්‍රියා කරන බැවින් අපට ඇත්තේ කුමන පිහිටක්ද? එතුමන් සිය කැමැත්ත ඉටු කරන අතර, තමන්ට අභිමත පරිදි නියම කරන සේක. එබැවින් ඔබට වඩාත් යහපත් වන්නේ එතුමන්ගේ අභිමතයට හිස නමා සර්ව සානුකම්පිත ස්වාමීන් වහන්සේ කෙරෙහි සිය විශ්වාසය තැබීමයි."**[17]

## 9 වන කොටස

අප මේ දක්වා අධ්‍යනය කළ සෑම කරුණකටම අනුව, යාඥාවේදී දෙවියන්වහන්සේ වෙත යොමුවීම ආධ්‍යාත්මික ජීවිතයක අත්‍යාවශ්‍ය සාධකයකි. උදෑසන අවදිවූ විගස මෙන්ම නින්දට යෑමට පෙර දෙවියන්වහන්සේට යාඥා කිරීම කෙතරම් මිහිරිවනු ඇත්ද? අප දිනපතා යාඥා කිරීමේදී ඒ සඳහා ගත කරන කාලය, යාඥාවන් ප්‍රමාණය ඒ වෙනුවෙන් අපගේ ඇති අවශ්‍යතාවය සහ ආධ්‍යාත්මික පිපාසය මත රඳා පවතී. බහාඋල්ලා තුමා, බාබ් තුමා සහ අබ්දුල් බහාතුමා විසින් අනාවරණය කරන ලද යාඥාවන් බොහෝ ප්‍රමාණයක් අතුරින් විවිධ අවස්ථාවන්ට සරිලන යාඥාවන් තෝරාගැනීමේ අවකාශ පවතී. එමෙන්ම, බහාඋල්ලා තුමා විසින් දෛනික අනිවාර්යය යාඥාවන් තුනක් අනාවරණය කර තිබේ. ෂෝගි එෆෙන්ඩි තුමා විසින් මෙසේ පවසයි:

**"සංඛ්‍යාත්මක වශයෙන් දෛනික අනිවාර්යය යාඥාවන් තුනකි. කෙටි අනිවාර්යය යාඥාව තනි පදායකින් සමන්විත වන අතර මධ්‍යන්නය කාලයේදී පැය විසිතරකට වරක් කිව යුතුයි. 'උන්වහන්සේ හැර අන්දෙවි කෙනෙක් නැති බවට දෙවියන්වහන්සේ සාක්ෂි වන සේක.' යන පදායන් වලින් මධ්‍යම අනිවාර්යය යාඥාව සමන්විත වන අතර දිනකට තෙවරක් උදෑසන, දහවල සහ සවස් යාමයේ යනාදි වශයෙන් කිව යුතුයි. මෙම යාඥාව කිරීමේදී සුවිශේෂී වූ අංග චලනයන් සහ ඉරියව් භාවිතා කරයි. මෙම යාඥා ත්‍රිත්වය අතරින් වඩාත් සංකීර්ණ යාඥාව වන, දීර්ඝ අනිවාර්යය යාඥාව, සෑම පැය විසිහතරකටම වරක් තමන්ට සුදුසු යැයි හැඟෙන ඕනෑම අවස්ථාවක කළ හැකිය."**

**"බැතිමතෙකුට මේ යාඥා තුන අතරින් තමන් කැමති ඕනෑම යාඥාවක් තෝරා ගැනීමේ සම්පූර්ණ නිදහස හිමිවන අතර ඒ එකිනෙකට නියමිත විශේෂ උපදෙස් ඇත්නම් ඒවා පිළිපදිමින් එක යාඥාවක් අනිවාර්යයෙන් කීමේ යුතුකමින් බැඳී සිටී."**[18]

එතුමා තවදුරටත් විස්තර කරයි:

**"මේ දෛනික අනිවාර්යය යාඥාවනුත්, සුවකිරීමේ යාඥාව, අහමඩ්ගේ පත්‍රකය වැනි වෙනත් සුවශේෂී යාඥාවනුත් සමඟ බහාඋල්ලා තුමා විශේෂ වැදගත්කමකින් හා බලයකින් යුක්ත කර තිබෙන බැවින් ඒවා පිළිගෙන, ප්‍රශ්න කිරීමකින් තොර භක්තියකින් හා විශ්වාසයෙන් යුතුව බැතිමතුන් විසින් කියවනු ලැබිය යුතු අතර දෙවියන්වහන්සේ සමඟ සමීප සංවාදයකට එළඹී උනවහන්සෙගේ නීති හා අණපනත් වඩා පරිපූර්ණව පිළිපැදිය හැකිවන්නේ එවිටය."**[19]

බහාඋල්ලා තුමා විසින් අනාවරණය කරන ලද දෛනික අනිවාර්යය යාඥාවන් සිදු කළ යුත්තේ තනි වශයෙනි. චාරිත්‍රයක් වශයෙන් කණ්ඩායමක් ලෙස සාමුහිකව ගායනා කරනු ලබන අනිවාර්යය යාඥාවන් බහායි ධර්මය තුළ නොපවතී. සාමූහික වශයෙන් ගායනා කරනු ලබන එකම යාඥාව ලෙස බහායි නීතියේ සඳහන්වන්නේ මළවුන්ගේ යාඥාවයි. එය භූමි දානයට පෙර, පැමිණ සිටින කෙනෙකු විසින් ගායනා කළ යුතු අතර, කණ්ඩායමේ ඉතිරි අය නිශ්ශබ්දව සිටගෙන සිටිය යුතුයි.

1. අනිවාර්යය යනු වචනයෙහි තේරුම කුමක්ද? ____________________________________________________________________________________________________________________________

2. බහාඋල්ලා තුමා අනිවාර්යය යාඥා කීයක් අනාවරණය කර තිබේද? ____________________________________________________________________________________________________________________________

3. අප මෙම යාඥා තුනම දිනපතා ගයනා කළ යුතුද? ______________________________________________________

4. අප දීර්ඝ අනිවාර්යය යාඥාව තෝරා ගනු ලැබුවේ නම්, එය දිනකට කීවරක් කිව යුතුද? _________________________________________________________________________________________

5. මධ්‍යම අනිවාර්යය යාඥාව තෝරා ගනු ලැබුවේ නම්, එය දිනකට කීවරක් කිව යුතුද? ______________

6. කෙටි අනිවාර්යය යාඥාව තෝරා ගනු ලැබුවේ නම්, එය දිනකට කීවරක් කිව යුතුද? _______________

7. විශේෂ බලයක් ඇති යාඥාවන් කිහිපයක් සඳහන් කරන්න. _______________________________________________________________________________________________________________________________________________________________________________________________________________________________________________

8. ඔබ මේවනතෙක් කෙටි අනිවාර්යය යාඥාව කටපාඩම් කරගෙන නොමැතිනම් දැන් එය කටපාඩම් කර ගන්නා ලෙස යෝජනා කරනු ලැබේ.

   **"මාගේ දෙවියනි, ඔබ දැන හඳුනා ගනු සඳහාත්, ඔබ වදිනු පුදනු සඳහාත් මා මැවූ වගට මම සාක්ෂි වෙමි. මාගේ දුබල බවට හා ඔබගේ ශක්තියටත්, මාගේ නිදන බවට හා ඔබගේ ඓශ්වර්යටත් මම මේ අවස්ථාවේදී සාක්ෂි වෙමි. අපදාවෙහි පිහිටවන්නාවූත්, ස්වයංභූ වූත් ඔබ හැර අන්‍යයතර දෙවි කෙනෙක් නැත"[20]**

9. මේ යාඥාවේදී අප සාක්ෂි වන්නේ කුමකටද? ________________________________________________________________________________________________________________________________________________________________________________________________________________________________________________________________________________________________________________

## 10 වන කොටස

අනිවාර්යය යාඥාවේ සඳහන් නීති අණපනත් වලට කීකරුවීමෙන් අපට ලැබෙන ආශිර්වාදයන්ට අමතරව තනිවම කියනු ලබන අනෙකුත් යාඥාවන්ගෙන් ආධ්‍යාත්මික පෝෂණය, කුඩා හෝ වේවා විශාල හෝ වේවා සාමූහික යාඥා මෙහෙයන්හිදී එම යාඥා ශ්‍රවණය වනවිට අපගේ ආත්මය උසස් තත්වයකට රැගෙන එයි. බහාඋල්ලා තුමා අපට මෙසේ පවසයි:

**"අතිශය ප්‍රමෝදයෙන් සහ මිත්‍රත්වයෙන් යුතුව එකට එකතුවී සානුකම්පිත ස්වාමීන් විසින් අනාවරණය කරන ලද පද්‍යයන් ගායනා කරන්න. මෙසේ කිරීමෙන් ඔබගේ අභ්‍යන්තර පැවැත්මට සත්‍ය දැනීමේ දොරටු විවෘතවී, ඔබගේ හදවත් ස්ථිර භාවයෙන් හා දීප්තිමත් ප්‍රීතියෙන්ද පිනා යනබවට ඔබගේ හදවත්වලටම ගම්‍ය වනු ඇත."[21]**

අප සියලු දෙනා මූලික වශයෙන් මහත් ප්‍රීතියට පත්වන අවබෝධයක්නම්, ලෝකය පුරාම, මිතුරන් සහ අසල්වැසියන් එකට එක්වී දෙවියන්වහන්සේ සමඟ සංවාදයේ යෙදෙන ආධ්‍යාත්මික මෙහෙයන් දහස් ගණනකින් ගුණනයවී ඇති බවයි. විශ්ව අධිකරණ මණ්ඩලය මෙසේ සටහන් කරයි:

**"ආධ්‍යාත්මික මෙහෙයක් යනු ඕනෑම ආත්මයකට සම්බන්ධ වියහැකි, දිව්‍යමය සුභන්ධය ආශ්වාස කළ හැකි, යාඥාවේ මිහිරියාව අත්විඳිය හැකි, නිර්මාණාත්මක ලෝකය පිළිබඳව භාවනා කළ හැකි සහ එකම අත්‍යාදරණීයන් සමඟ සංවාදයේ යෙදිය හැකි අවකාශයන් වේ. මිත්‍රත්වයේ සහ පොදු අභිප්‍රායක් පිළිබඳ හැඟීමක් ජනිත වූවිට, විශේෂයෙන්ම එවැනි අවස්ථාවන්හීදි ස්වාභාවිකවම ආධ්‍යාත්මික උච්චස්ථානයකට පත් සංවාදයන් පැන නැඟී 'මනුෂ්‍ය හදවත නමැති නගරය' මේ තුලින් විවෘත වේ."[22]**

අපට යාඥා කිරීමට අවශ්‍යවූ විට, ලෞකික දේවලින් අපගේ සිත පිරිසිදු කරගැනීම සඳහා මඳ වේලාවක් සිටිමු. අප යාඥා කරනවිට අපගේ සිතුවිලි දෙවියන්වහන්සේ වෙත යොමු කළ යුතුයි. අප යාඥා කර අවසන්වූ විගස වෙනත් කටයුත්තක් සඳහා එකවර යොමු නොවී ටික වේලාවක් නිශ්ශබ්දව සිටිය යුතුයි. රැස්වීමකදී අන්අය කරනු ලබන යාඥාවන්ට සවන්සෙන විටද ඉහත ආකාරයම පිළිපැදිය යුතුය. එවැනි අවස්ථාවන්වලදී අප යාඥා පූර්වක ආකල්පයක් පවත්වාගත යුතු අතර එම වචන පිළිබඳ සාවදානව මෙනෙහි කළ යුත්තේ එය තමන්ම කරනු ලබන යාඥාවක් ලෙස හැඟී යන පරිදිය.

1. අප එකට එක්ව දෙවියන්වහන්සේගේ පද්‍යයන් ගායනා කරනු ලබන විට අප සතුවිය යුතු ආධ්‍යාත්මිකත්වය කුමක්ද? ______________________________

2. දෙවියන්වහන්සේගේ පද්‍යයන් එකට එක්වී ගායනා කිරීමෙන් ලැබෙන බලපෑම කුමක්ද? __________
________________________________________
________________________________________

3. ආධ්‍යාත්මික මෙහෙයක් යනු ඕනෑම ආත්මයකට සම්බන්ධ වියහැකි
_______________ ,
___________________________ ,
___________________________ ,
___________________________ ,
____________________________________ සහ
____________________________________ අවකාශයන් වේ.

4. ආධ්‍යාත්මික මෙහෙයකදී ජනිතවල හැඟීම් මොනවාද? ______________________
________________________________________

5. ආධ්‍යාත්මික මෙහෙයන්හීදි ස්වාභාවිකව උච්චස්ථානයකට පත් සංවාදයන් තුළින් ඇතිවන බලපෑම් මොනවාද? ____________________________________
________________________________________

6. අප තනිව හෝ රැස්වීමකදී යාඥා කරනවිට, අප සතුවිය යුතු ගෞරවාන්විත ආකල්පය පිළිබඳ වචන කිහිපයක් ලියන්න.

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

## 11 වන කොටස

මෙම පොතෙහි පළමු ඒකකයේදී දිනපතා ශුද්ධවූ ලේඛනවලින් උපුටාගත් කොටස් කියවීමේ සහ එහි අර්ථය පිළිබඳව ගැඹුරින් සිතා බැලීමේ පුරුද්ද පිළිබඳව අවධානය යොමු කළෙමු. මෙම ඒකකයේදී යාඥා කිරීමේ වැදගත්කම පිළිබඳ සමාලෝචනය කළ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන්, දිනපතා යාඥා කිරීමේ පුරුද්ද ශක්තිමත් කරගන්නා ලදි. කලින් කොටසේදී සාමූහික නමස්කාරයෙහි ඇති වැදගත්කම පිළිබඳ ඔබගේ අවධානය යොමු කළෙමු. මේ දක්වා ඔබ අධ්‍යනය කරන ලද දෙයින් ඔබව සූදානම් කරවනු ලැබුයේ ඔබගේ අභිමතය පරිදි සේවා මාර්ගයේ පළමුවන සේවා කාර්යය වන: ආධ්‍යාත්මික මෙහෙයක් පැවැත්වීම සඳහා ඔබව සූදානම් කිරීමටයි.

මූලික පියවර ලෙස, ඔබ යාඥා කිහිපයක් කටපාඩම් කළ යුතු අතර මිතුරන් කිහිප දෙනෙකු සමඟ ඒවා බෙදාහදා ගැනීමට අවස්ථාවක් සලසා ගතයුතුය. ඒ සමඟම, අඩුම තරමින් ඔබගේ සමාජයේ පවතින එක් ආධ්‍යාත්මික මෙහෙයකටවත් සහභාගි වන බවට සහතිකවී, එහි සිටින උද්‍යෝගිමත් සහභාගිවන්නන් පිළිබඳ සලකා බලන්න. කාලයත් සමඟ, ඔබම ආධ්‍යාත්මික මෙහෙයක් පැවැත්වීමට තීරණය කරනු ලබන අතර, එයට ඔබගේ මිතුරන්, පවුලේ සාමාජිකයින් සහ අසල්වැසියන් ක්‍රමානුකූලව යාඥා කිරීම සඳහා මෙන්ම මිත්‍රත්වයෙන්ද රැස්වෙනු ඇත. මෙම පාඨමාලාවට සහභාගිවූ මිතුරන් දෙනෙකු හෝ තිදෙනකු එකට එකතුවී ආධ්‍යාත්මික මෙහෙයන් ආරම්භ කිරීමද පොදු කාරණයක් වනු ඇත.

ඔබට සිතාගත හැකි පරිදි, ආධ්‍යාත්මික මෙහෙයක් සංවිධානය කිරීම සඳහාවූ සම්මත රීතියක් නැත. නමුත් පැහැදිලිවම, මිතුරන් යාඥා කිරීම සඳහා හමුවන හමුවක් වන අතර, තෝරාගත් ලේඛන කියවීමෙන්ද, උසස් සංවාදයන් සිදුවන ප්‍රකටවම ආධ්‍යාත්මික වාතාවරණයක් සහිත හමුවක් වේ. ආධ්‍යාත්මික මෙහෙයක් පැවැත්වීම යන අන්තර්ගතය තුළ, පහත සඳහන් අදහස් පිළිබඳව ඔබට වචන කිහිපයක් කිවහැකිද?

උණුසුම් සහ ආදරණීය ආරාධනාවක් කිරීම. ______________________________

______________________________________________

______________________________________________

______________________________________________

සත්කාරක වාතාවරණයක් නිර්මාණය කිරීම. ______________________________

______________________________________________

______________________________________________

______________________________________________

ගෞරවාන්විත වාතාවරණයක් පවත්වාගනෙ යාම. ______________________________

______________________________________________________________

______________________________________________________________

______________________________________________________________

ප්‍රීතිමත් මිත්‍රත්වයක් ඇති කිරීම. ______________________________

______________________________________________________________

______________________________________________________________

______________________________________________________________

ආධ්‍යාත්මිකව උසස් සංවාදයන් සඳහා උනන්දු කරවීම. ______________________________

______________________________________________________________

______________________________________________________________

______________________________________________________________

## REFERENCES


1. Gleanings from the Writings of Bahá'u'lláh (Wilmette: Bahá'í Publishing Trust, 1983, 2017 printing), XLIII, par. 4, p. 105.

2. Bahá'u'lláh, in Trustworthiness: A Compilation of Extracts from the Bahá'í Writings, compiled by the Research Department of the Universal House of Justice (London: Bahá'í Publishing Trust, 1987), no. 21, p. 5.

3. The Call of the Divine Beloved: Selected Mystical Works of Bahá'u'lláh (Haifa: Bahá'í World Centre, 2018), no. 2.43, p. 31.

4. From a talk given on 5 May 1912, published in The Promulgation of Universal Peace: Talks Delivered by 'Abdu'l-Bahá during His Visit to the United States and Canada in 1912 (Wilmette: Bahá'í Publishing, 2012), p. 127.

5. Bahá'u'lláh, The Hidden Words (Wilmette: Bahá'í Publishing Trust, 2003, 2012 printing), Arabic no. 13, pp. 6–7.

6. From a letter dated 8 December 1935 written on behalf of Shoghi Effendi, published in Prayer and Devotional Life: A Compilation of Extracts from the Writings of Bahá'u'lláh, the Báb, and 'Abdu'l-Bahá and the Letters of Shoghi Effendi and the Universal House of Justice, compiled by the Research Department of the Universal House of Justice (Wilmette: Bahá'í Publishing, 2019), no. 71, p. 31.

7. Words of 'Abdu'l-Bahá, cited by J. E. Esslemont, Bahá'u'lláh and the New Era: An Introduction to the Bahá'í Faith (Wilmette: Bahá'í Publishing, 2006, 2017 printing), p. 106.

8. Ibid.

9. Bahá'u'lláh, in Bahá'í Prayers: A Selection of Prayers Revealed by Bahá'u'lláh, the Báb, and 'Abdu'l-Bahá (Wilmette: Bahá'í Publishing Trust, 2002, 2017 printing), pp. 7–8.

10. Ibid., p. 9.

11. Words of 'Abdu'l-Bahá, cited in Star of the West, vol. 8, no. 4 (17 May 1917), p. 41.

12. Gleanings from the Writings of Bahá’u’lláh, CXXXVI, par. 2, p. 334; also in Bahá’í Prayers, p. iii.

13. Bahá’u’lláh, in Bahá’í Prayers, pp. 8–9.

14. Ibid., p. 12.

15. ‘Abdu’l-Bahá, in Prayer and Devotional Life, no. 24, p. 7.

16. From a talk given by ‘Abdu’l-Bahá on 5 August 1912, published in The Promulgation of Universal Peace, p. 345.

17. Selections from the Writings of ‘Abdu’l-Bahá (Wilmette: Bahá’í Publishing, 2010, 2015 printing), no. 22.1, pp. 75–76

18. From a letter dated 10 January 1936 written on behalf of Shoghi Effendi, published in Prayer and Devotional Life, no. 61, p. 25.

19. From a letter dated 10 January 1936 written on behalf of Shoghi Effendi, quoted in Bahá’í Prayers, p. 301.

20. Bahá’u’lláh, in Bahá’í Prayers, p. 4.

21. Bahá’u’lláh, in Prayer and Devotional Life, no. 68, p. 29.

22. From a message dated 29 December 2015, published in Framework for Action: Selected Messages of the Universal House of Justice and Supplementary Material, 2006–2016 (West Palm Beach: Palabra Publications, 2017), no. 35.49, p. 232.



# ජීවිතය සහ මරණය

**අරමුණ**

ජීවිතය හුදෙක් මේ ලෝකයේ සිදුවීම් සහ අවස්ථාවන්
වලින් පමණක් යුක්ත නොවන බව වටහාගැනීම සහ
ආත්මයේ සංවර්ධනය තුලින් එහි
සත්‍ය වැදගත්කම සොයා ගැනීම

## 1 වන කොටස

මනුෂ්‍ය ආත්මය ද්‍රව්‍යයන්ට හා භෞතික ලෝකයට වඩා උසස් වේ. අබ්දුල් බහා තුමා මෙසේ පවසා ඇත.

**"භෞතික ශරීරය පරමාණුවලට සංයෝජනයක් වන අතර මෙම පරමාණු වෙන්වීම ආරම්භවන දිරාපත්වීමේ ස්ථාවරයේදී අප විසින් පවසන මරණය ළඟාවේ.....**

**"ආත්මය හා සැසඳීමේදී මෙය වෙනස් වේ. ආත්මය යනු මූලද්‍රව්‍යයන්ගේ එකතුවක් නොවන අතර, කිසිදු පරමාණුන්ගේ සංයෝජනයක්ද නොව, එය බිඳලිය නොහැකි වස්තුවක් වන හෙයින් සදාකාලික වේ. එය සම්පූර්ණයෙන්ම භෞතික නිර්මාණ පටිපාටියෙන් බැහැර වන අතර එය අමරණීය වේ"**[1]

1. "සංයෝජනය" යන්නෙහි අර්ථය කුමක්ද? ______________________________
2. භෞතික ශරීරය මෙන්ම මනුෂ්‍ය ආත්මය විවිධ මූලද්‍රව්‍යයන්ගෙන් සංයෝජනයවී ඇත්ද? __________
3. මනුෂ්‍ය ආත්මය භෞතික වස්තුවක්ද? ______________________________

## 2 වන කොටස

ආරක්ෂකවරයා වෙනුවෙන් ලියන ලද ලිපියක් "මනුෂ්‍ය ආත්මය ආරම්භවන්නේ පිළිසිඳ ගැනීමේදීය."[2] ලෙස සඳහන් කර ඇති අතර "පිළිසිඳ ගැනීම" යන්නෙහි අර්ථය පිළිබඳ ප්‍රශ්නයට විශ්ව අධිකරණ මණ්ඩලයේ දැක්වූ පිළිතුරක මෙසේ සටහන්ව ඇත.

**"බහායි ලේඛන කිසිවක් තුල 'පිළිසිඳ ගැනීම' යන දැක්වීමෙහි ජෛවවිද්‍යාත්මක නිමේෂය සහ ස්වභාවය නිවැරදිව අර්ථ දක්වීමක් සොයාගෙන නොමැත. මෙම නියමය වෛද්‍ය විද්‍යාවට අනුව යෙදීම නිවැරදි නොවනබවට පෙනී ගොස් ඇත. සැබවින්ම, මේ පිළිබඳ ඇති එක් අවබෝධයක්නම් ගැබ්ගැනීමක් සිදුවන්නේ සංසේචනයකින් අනතුරුව බවත්; අනෙක රෝපණය කිරීමට හරහා සිදුවන ගැබ්ගැනීමයි. එමනිසා ආත්ම භෞතික රූපය හා සම්බන්ධවන අවස්ථාව පිළිබඳව දැනගැනීමට නොහැකි වන අතර එවැනි ප්‍රශ්නයක් මිනිසුන්ගේ සිතුවිලි වලින් විසඳීමට හෝ පරීක්ෂකර බැලිය නොහැකි වන්නේ එය ආධ්‍යාත්මික ලෝකයේ අභිරහස් වලට සහ ආත්මයේ ස්වාභාවය නිසාය."**[3]

1. මනුෂ්‍ය ආත්මය ආරම්භ වන්නේ කවදාද? ______________________________
______________________________
2. "පිළිසිඳ ගැනීම" යන නියමය ජෛවවිද්‍යාමත්මක නිමේෂය පිළිබඳ නිවරදිව විස්තර කර තිබේද? ______
______________________________

## 3 වන කොටස

ආත්මය හා ශරීරය අතර භෞතික සම්බන්ධතාවයක් නොමැති බවත් එය ශරීරයට ඇතුළුවන්නේ හෝ එයින් පිටවන්නේද නැති අතර එය භෞතික අවකාශයක් අත්පත් කර නොගනී. ශරීරය සමඟ එහි සංඝටනය අලෝකය සහ එය පරාවර්ථනය කරන කණ්ණාඩියක් හා සමානවේ. ආලෝකය කණ්ණාඩිය තුලින් පෙනීගියද ආලෝකය ඒතුල නොවේ.එපරිද්දෙන්ම අබ්දුල් බහාතුමා පෙන්වා දෙන පරිදි ආත්මය ශරීරය තුලද නොවේ.

**"යුක්ති සහගත ආත්මයක් හෝ මනුෂ්‍ය ආත්මයක් සහජයෙන් මේ ශරීරය තුළ වැඩෙන්නේ නැති අතර ඒ පිළිබඳ කිවහොත්, ආත්මයක් ශරීරයට ඇතුළු නොවන අතර ඇතුල්වීම හා සහජ බව ශරීරයන්ගේ ලක්ෂණය වන අතර යුක්ති සහගත ආත්මයක් ඒ සියල්ලට ඉහළින් පවිත්‍රව පවතී. එය ආරම්භවීම සඳහා කිසිදිනක මේ ශරීරයට ඇතුළුවන්නේ නොමැති අතර වෙනත් වාසස්ථානයක අවශ්‍යතාව පවතින්නේ එය අතහැර යාමෙන් පසුය. නැත, ආත්මය හා ශරීරය අතර සම්බන්ධතාවය ලාම්පුවක් හා කණ්ණාඩියක් අතර ඇති සම්බන්ධතාවය හා සමාන වේ. කණ්ණාඩිය ඔපනංවා සහ පරිපූර්ණව පවතීනම් ලාම්පුවේ එළිය එය මත ප්‍රකාශය වන අතර කණ්ණාඩිය බිඳී හෝ දූවිලවලින් ආවරණයවී පවතීනම් ආලෝකය සැඟව පවතී"[4]**

1. පහත සඳහන් වාක්‍යයන්හි හිස්තැන් පුරවන්න

   I. යුක්ති සහගත ආත්මයක් හෝ ______________ සහජයෙන් මේ ශරීරය තුළ වැඩෙන්නේ හෝ නැති අතර ඒ පිළිබඳ කිවහොත්, ආත්මයක් ශරීරයට ___________________________.

   II. ________________ ආත්මයක් හෝ මනුෂ්‍ය ආත්මයක් ශරීරයට ඇතුළු නොවන අතර ඇතුල්වීම හා සහජ බව ________________වන අතර යුක්ති සහගත ආත්මයක් _______________________.

   III. එය ආරම්භවීම සඳහා කිසිදිනක _____________________ නොමැති අතර _______ ____________________ පවතින්නේ එය අතහැර යාමෙන් පසුය.

   IV. ආත්මය හා ශරීරය අතර සමබන්ධතාවය ______________________________ _________________________ වේ.

   V. කණ්ණාඩිය ඔපනංවා සහ පරිපූර්ණව පවතීනම් ___________________________ එය මත ප්‍රකාශය වේ.

   VI. කණ්ණාඩිය බිඳී හෝ දූවිලිවලින් ආවරණයව පවතීනම් ______________________ ______________.

2. මේ දක්වා අප ඉගෙනගන්නා ලද කරුණු මත පදනම්ව පහත සඳහන් ඒවායින් කවරක් නිවැරදිදැයි නිශ්චය කරන්න.

   _____ ආත්මය භෞතික ලෝකයට අයත් නොවේ.
   _____ ආත්මය ඇත්තේ ශරීරය තුලය.
   _____ ශරීරය ආත්මයේ අයිතිකරුයි.
   _____ ආත්මය අමරණියයි.
   _____ ආත්මය කළලය හා සම්බන්ධවූ විට ඔහුගේ හෝ ඇයගේ ආරම්භය සිදුවේ.
   _____ පුද්ගලයෙකුගේ ජීවිතය ආරම්භවන්නේ මෙලොවට බිහිවූ පසුවය.
   _____ මරණයෙන් පසුව පුද්ගලයෙකුගේ භෞතික පැවැත්ම දිගටම පවතී.
   _____ ජීවිතය එදිනෙදා සිදුවන සිදුවීම්වලින් යුක්තවේ.

3. ආලෝකය සහ කණ්ණාඩිය ඇසුරෙන් ශරීරය හා ආත්මය අතර ඇති සම්බන්ධතාවය විස්තර කරන්න.

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

## 4 වන කොටස

ආත්මය සහ ශරීරය අතර පවතින සුවිශේෂී සම්බන්ධතාවය වන්නේ ඒ දෙක එක්වීමෙන් මනුෂ්‍ය වර්ගයා සෑදෙන බැවිනි. මෙම සම්බන්ධතාවය පවතින්නේ මරණය දක්වා පමණි. මේ දෙක අතරේ ඇති සම්බන්ධය අවසන් වනවිට ඒවා නැවතත් එයට අදාළ මූලාරම්භක ස්ථානයන් වන ශරීරය දූවිලි ලෝකයටත් ආත්මය දෙවියන්වහන්සේගේ ආධ්‍යාත්මික ලෝකයට ගොස් එහි ප්‍රගතිය කරාත් ගමන් කරයි. අබ්දුල් බහාතුමා මෙසේ පවසා ඇත.

**"මනුෂ්‍ය ආත්මයක ආරම්භය සිදුවුවත් එහි අවසානයක් නැත; එය සදාකාලිකවම නොනැසී පවතී"**[5]

එතුමා එය පැහැදිලි කරමින් මෙසේ පවසා ඇත.

**"ආත්මයට ශරීරයක ආවශ්‍යතාව නැතිමුත් ශරීරයට ආත්මයක් අවශ්‍ය අතර එය නොමැතිව ජීවත්විය නොහැක. ආත්මයකට ශරීරයක් නොමැතිව ජීවත්විය හැකිවුවද ආත්මයක් නොමැතිව වුවහොත් ශරීරය මරණයට පත්වේ."**[6]

ආරක්ෂකවරයාද මෙසේ විස්තර කර තිබේ.

**"මනුෂ්‍ය ආත්මය හ සැලකීමේදී; බහායි ඉගැන්වීම්වලට අනුව මනුෂ්‍ය කළලය නිර්මාණයවීමේදී මනුෂ්‍ය ආත්මය ආරම්භවී, එහි ප්‍රගතිය කරායෑම ආරම්භව එය ශරීරයෙන් වෙන්වීමෙන් පසු සදාකාලිකත්වයේ පැවැත්ම දක්වා ගමන් කරයි. එමනිසා එහි ප්‍රගතිය සීමාරහිතය."**[7]

1. ඉහත උද්ධෘත පාඨයන් සිහියේ තබාගෙන පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

    I. ශරීරයට ආත්මයක් අවශ්‍යද? ______________________

    II. ආත්මයකට ශරීරයක් අවශ්‍යද? ______________________

    III. අප මරණයට පත්වන විට ආත්මය හා ශරීරය අතර සම්බන්ධතාවයට සිදු වන්නේ කුමක්ද? _______

    ______________________________________

    IV. මරණින් පසු ආත්මයට සිදු වන්නේ කුමක්ද? ______________________

    ______________________________________

    V. ආත්මයේ ප්‍රගතිය කොපමණ කාලයක් පවතීද? ______________________

    ______________________________________

    VI. ජීවිතය අවසාන වන්නේ කවදාද? ______________________

    ______________________________________

2. මෙම කොටස තුළදී අප ඉගෙනගත් කරුණුවලට එකඟවන්නේ පහත සඳහන් කුමන ප්‍රකාශනයන්දැයි තීරණය කරන්න.

________මරණය යනු දඬුවමකි.

________ආත්මය හා ශරීරය අතර සම්බන්ධතාවය පවතින්නේ මෙලොව ජීවිත කාලය තුල පමණි.

________ශරීරයට සදාකාලිකව ප්‍රගතියට පත්වීමේ හැකියාවක් ඇත.

________ආත්මය සදාකාලික ප්‍රගතිය කරා ගමන් කරයි.

________මරණය ජීවිතයේ අවසානයයි.

________අපගේ ශරීරයන් නැඟී සිටින කල තීන්දුවේ දිනය පැමිණේ.

________මරණියේදී ආත්මයට ඊට පෙර තිබුණාට වඩා නිදහසක් හිමිවේ.

________ජීවිතය මරණයත් සමඟ අවසන්වේ.

________අප මරණයට බිය විය යුතුය.

________ආහාර, ඇඳුම්, විවේකය සහ විනෝදය යනාදිය ආත්මයට අනිවාර්යවේ.

________ශරීරයට ආත්මයේ ශක්තීන් පරිහරණය කිරීම නිසා එය වෙහෙසට පත්වේ.

________ශරීරයේ දුර්වලතාවයන්ගෙන් හෝරෝගීභාවයෙන් ආත්මයට බලපෑමක් නැත.

________මනුෂ්‍යාත්වයට මරණින් පසුවද භෞතික අවශ්‍යතා පවතී.

## 5 වන කොටස

ආත්මය භෞතික වස්තූන් මෙන් භෞතික අවකාශයක් අත්පත් කරගන්නේ හෝ ස්වාභව ධර්මයේ නියමයන්ට අනුකූලව ක්‍රියාකරන්නේ හෝ නැති බව අප දක්නා ලදි. ශරීරයේ නියෝජිත්වය හරහා ආත්මය එහි බලපෑම මේ ලෝකයට යොදවන අතර ආත්මය එහි බලපෑම ක්‍රියාවට නංවන එකම මාර්ගය එයද නොවේ. බහාඋල්ලා තුමා මෙසේ පවසා ඇත.

> **"සහතික වශයෙන්ම මම ප්‍රකාශ කර සිටින්නේ, මනුෂ්‍ය ආත්මය සියළුම ප්‍රතිගමනයෙන් හා ආගමනයන්ට ඉහළින් පිහිටා ඇති බවයි. එය නිසොල්මන්ය, එලෙසම ඉතා ඉක්මණින් ඉහළ ගමන්කරන,එය සැරිසරමින් නමුදු නිසොල්මන්ව සිටී."**[8]

අබ්දුල් බහාතුමා අපට මෙසේ පවසා ඇත.

> **" මනුෂ්‍ය ආත්මයේ බලපෑම සහ ප්‍රත්‍යක්ෂය දෙයාකාරයකින් පවතින බවට දැනගන්න; එනම් අවබෝධ කරගැනීමේ සහ ක්‍රියාත්මකවීමේ ක්‍රම දෙකක් මනුෂ්‍ය ආත්මය සතුවේ. එක් ක්‍රමයක් නම් ශරීරයේම අවයවයන්ගේ හා ඉන්ද්‍රියන්ගේ මැදිහත්වීම හරහාය. එනම් ඇස්වලින් දැකීමත්, කන් වලින් ශ්‍රවණය කිරීමත්, දිවෙන් කථා කිරීමත්ය......**
>
> **"ශරීරයේ අවයවයන් සහ ඉන්ද්‍රියන් නොමැතිව ආත්මයේ බලපෑම සහ ක්‍රියාවන් අනෙක් ක්‍රමයයි."**[9]

1. පහත සඳහන් වාක්‍යයේ හිස්තැන් පුරවන්න:

I. මනුෂ්‍ය ආත්මය සියළුම __________ හා ___________ ඉහළින් පිහිටා ඇත.

II. එය ___________එලෙසම ________________.

III. එය _______________නමුදු ______________සිටී.

2. ආත්මය මේ ලෝකයට එහි බලපෑම සහ ප්‍රත්‍යක්ෂ කිරීම සිදු කරන ආකාර දෙකක් පිළිබඳ විස්තර කරන්න.

3. ශරීර අවයවයන් නොමැතිව ආත්මයේ බලපෑම සහ ක්‍රියාවන් පිළිබඳ උදාහරණයන් සඳහන් කරන්න.

## 6 වන කොටස

ඉහත කොටසෙහි සිදුකල සාකච්ඡාවෙන් ලද අවබෝධයත් සමඟ බහාඋල්ලා තුමාගේ ලේඛනවලින් උපුටාගත පහත සඳහන් පාඨය කියවන්න.

> **"මනසේ හෝ ශරීරයේ දුර්වලතාවයන්ගෙන් නිදහස්ව මනුෂ්‍ය ආත්මයන් උසස් බවට පත්කර ඇති බව ඔබලා දැනගන්න. අසනීපවූ පුද්ගලයෙකු ඔහුගේ ආත්මය හා ශරීරය අතර සම්බන්ධයට විරුද්ධවන දුර්වලතාවයක් පෙන්වුවද, ආත්මයක් ශාරීරික රෝගාබාධවලින් වියුක්තව පවතී. ලාම්පුවේ ආලෝකය පිළිබඳ සලකා බලන්න. බාහිර කරුණු එහි දීප්තියට බාධා ඇති කළත්, ආලෝකය එහි උපරිම දීප්තිමත් බලයෙන් බැබළෙනු ඇත. ඒ ආකාරයෙන්ම, මනුෂය ශරීරයට පීඩා ගෙනදෙන සෑම රෝගව්‍යාදියක්ම ආත්මය එහි සහජ ශක්තිය සහ බලය ප්‍රකාශයට පත්කිරීමට බාධා කිරීමෙන් වැළැක්වෙන ඇත. කෙසේවෙතත්, එය ශරීරය අතහැර යෑමේදී එය ඉහළයාමට දක්වන උත්සාහ සහ එය අනාවරණය කරගන්නා බලපෑම මෙලොව කිසිදු බලයක් හා සමාන නොවේ. සෑම නිර්මලවූද, ශුද්ධළවූ සහ පිරිසිදු ආත්මයක්ම අතිවිශාල බලයකින් සමන්විත වන සේම සතුට උතුරායන ප්‍රමුදිත තත්වයකට පත්වනු ඇත."[10]**

1. ශරීරයේ හෝ මනසේ දුර්වලතාවයන් වලින් බලපෑමක් සිදුනොවී ආත්මය පවතින්නේ කෙසේද සහ එය ශරීරයෙන් වෙන්වන අවස්ථාව ප්‍රත්‍යක්ෂ කරමින් සිදුවන්නේ කුමකදැයි ඔබගේම වචන වලින් විස්තර කරන්න.

2. භෞතික ශරීරයේ මරණින් පසු අප අපගේ පුද්ගලිකත්වය පවත්වාගෙන යනවාද? ________________

## 7 වන කොටස

බහාඋල්ලා තුමා අපට මෙසේ පවසා ඇත.

**"ඊළඟට, මනුෂ්‍යයාගේ ආත්මය සහ මරණින් පසු එහි පැවැත්ම පිළිබඳව ඔබ නැඟූ ප්‍රශ්නය පිළිබඳවයි. ආත්මය පිළිබඳ ඔබලා දැනගත යුතු සත්‍යය නම්, එය ශරීරයෙන් වෙන්වීමෙන් පසු දෙවියන්වහන්සේගේ අභිමුවට එළඹීම දක්වා නොනැවතී ප්‍රගතියට පත්වන බවත්, එම තත්වය සහ අවස්ථාව යුගයන්ගේ හෝ ශත වර්ෂයන්ගේ විපර්යාසයන්ට හෝ මේ ලෝකයේ වෙනස්වීම්වලට හෝ අවස්ථාවන්ට වෙනස් කළ නොහැකි අන්දමකින් සිදුවන බවයි. දෙවියන්වහන්සේගේ රාජධානියත්, උන්වහන්සෙගේ ස්වාධිපත්‍යයත්, උන්වහන්සේගේ ආධිපත්‍යය සහ බලපරාක්‍රමත් පවතින තාක්කල් එයද පවතිනු ඇත. එය දෙවියන්වහන්සේගේ ලක්ෂණ හා උන්වහන්සේගේ ගුණාංග ප්‍රකාශයට පත් කරවන අතරම උන්වහන්සේගේ ආදර කරුණාව සහ ත්‍යාගශීලීභාවය අනාවරණය කරයි."**[11]

1. භෞතික මරණින් පසු කොපමණ කාලයක් ආත්මය ප්‍රගතිය කරා ගමන් කරයිද? ________________

   ________________________________________

2. ආත්මය දෙවියන්වහන්සේගේ අභිමුව දක්වා වූ එහි සදාකාලික ගමන් මඟ කුමන තත්වයක් යටතේ සිදුවෙයිද? ________________________________

   ________________________________________

   ________________________________________

3. එම තත්වයේදී ආත්මය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ඇතැම් ගුණාංග සහ ලක්ෂණයන් මොනවාද?

   ________________________________________

   ________________________________________

4. මේ දක්වා අප ඉගෙනගත් කරුණු පදනම්ව පහත සඳහන් ඒවා අතරින් නිවැරදි ප්‍රකාශ නිර්ණය කරන්න.

   __________ දෙවියන්වහන්සේගේ ලෝකය සදාකාලිකව පවතී.

   __________ ආත්මයට දෙවියන්වහන්සේගේ ගුණාංග ප්‍රකාශ කිරීමේ හැකියාව ඇත.

   __________ මළවුන් සඳහා අප කියනු ලබන යාඥාවන්ගෙන් ඔවුන්ගේ ආත්මයට බලපෑමක් සිදු නොවේ.

   __________ ආත්මයේ පැවැත්ම කිසිදිනක අවසන් නොවේ.

## 8 වන කොටස

බහාඋල්ලා තුමා මෙසේ ප්‍රකාශ කර ඇත.

**"සෑම ඇසෙනා කණක්ම පවිත්‍රව හා අකලංකව තබාගතහොත් සෑම වේලාවකම සහ සෑම දිශාවකින්ම 'ඇත්තවශයෙන්ම, අප දෙවියන්වහන්සේගේ වන්නෙමු, උන්වහන්සේ වෙතට ආපසු යන්නෙමු' යන ශුද්ධවූ වචනය උච්චාරණය කරන ශබ්දය ඇසිය යුතු බව ඔබලා දැන්ගන්න. මනුෂ්‍යයාගේ භෞතික මරණයේ සහ ඔහුගේ ආපසු ගමන් පිළිබඳ අභිරහස් හෙළිදරව් කර නැතුවාක් මෙන්ම තවමත් නොකියවා පවතී.**

**"මරණය යනු සෑම විශ්වාසී බැතිමතෙකුටම පිරිනමන ජීවිතය නමැති කුසලානයි. එය ප්‍රීතිය ගෙනඑන අතරම සතුට දාරාගෙන සිටී. එය සදාකාලික ජීවිතය නමැති ත්‍යාගය පිරිනමයි.**

**"දෙවියන්වහන්සේගේ මහිමයට ප්‍රශංසා වේවා, එකම සත්‍ය දෙවියන්වහන්සේ හඳුනාගැනීම නම් වූ මනුෂ්‍යාගේ ලෞකික ජීවිතයේ ඵලය රසවිඳ ඇති අයගේ මෙලොවින් පසු ජීවිතය අපට විස්තර කළ නොහැකි අන්දමේ එකක් වනු ඇත. ඒ පිළිබඳ දැනුම ඇත්තේ සියළුම ලෝකයන්ගේ ස්වාමීන් වූ දෙවියන්වහන්සේ තුල පමණි."**[12]

**" එම්බා පරමේශ්වර පුත්‍රය! මම ඔබට මරණය ප්‍රීති ජනක දූතයෙකු කළෙමි. ඉතින් ඔබ දුක් වන්නේ ඇයි? මම ඔබ මත එහි දීප්තිය විහිදුවීම සඳහා ආලෝකය මැව්මී. ඔබ එයින් සැඟවෙන්නේ ඇයි?"**[13]

1. පහත සඳහන් ප්‍රකාශයන්ගෙන් නිවැරදි වන්නේ කුමක්ද?

__________ මනුෂ්‍ය ආත්මය දෙවියන්වහන්සේ වෙතින් පැමිණ නැවත උන්වහන්සේ වෙතටම යයි.

__________ මරණින් පසු ජීවිතය පිළිබඳ සියළුම දැනුම ඇත්තේ දෙවියන්වහන්සේ තුලයි.

__________ සත්‍ය බැතිමතාට මරණය යනු ජීවිතයයි.

__________ මරණය යනු සතුට රැගෙන එන්නාය.

__________ මරණයේ අභිරහස් පිළිබඳ සියළු දෙනාම දැනුවත්ය.

__________ ජීවිතය නමැති ත්‍යාගයේ වටිනාකම අප ආරක්ෂා කළයුතු නමුත් මරණයට බිය විය යුතු නැත, එය ප්‍රීති ජනක පණිවිඩකරුවෙකි.

__________ මරණින් පසු ජීවිතය පිළිබඳ දැනුවත්වීම අපට වැදගත් නැත.

2. අප අධ්‍යනය කරන ලද කොටස්හි ඇතුළත්වූ කරුණු සිහියේ තබාගෙන, ජීවිතය, මරණය, ශරීරය සහ ආත්මය පිළිබඳ කෙටි ඡේදයක් ලියන්න.

______________________________

______________________________

______________________________

______________________________

______________________________

______________________________

______________________________

______________________________

______________________________

______________________________

______________________________

______________________________

______________________________

______________________________

______________________________

## 9 වන කොටස

අබ්දුල් බහාතුමා මෙසේ පවසා ඇත.

**“මනුෂ්‍යයා තම ජීවිතය ගර්භාෂ ලෝකය තුලදී ආරම්භ කරන අතර එහිදී මේ ලෝකයේ ඉදිරි පැවැත්ම සඳහා අවශ්‍යවන හැකියාවන් සහ යෝග්‍යතාවයන් සංවර්ධනය කරගනු ඇත. මේ ලෝකය සඳහා අවශ්‍ය බලයන් ඔහු ඒ ලෝකය තුළදී අත්පත් කරගන්නවා ඇත. මේ ලෝකය සඳහා ඔහුට අවශ්‍ය ඇස් ඔහු ගර්භාෂ ලෝකයේදී ලබාගන්නවා ඇත. මේ ලෝකය සඳහා අවශ්‍ය කණ් ඔහු ඒ ලෝකයේදී ලබාගනී. මේ ලෝකය සඳහා අවශ්‍ය සියළුම බලයන් ඔහු ගර්භාෂ ලෝකයේදී ලබාගන්නවා ඇත.මේ ලෝකය සඳහා යෝග්‍යවීමට එම ලෝකයේදී ඔහු සූදානම්වූ අතර මේ ලෝකයට පැමිණීමෙන් පසු ඔහුට මේ ලෝකය තුළදී අවශ්‍ය සියළුම උපකාරක බලයන් හිමිකරගෙන ඇති බවත් අවශ්‍යය සියළුම අවයවයන් හා ඉන්ද්‍රියින් ලබාගෙන ඇති බව පෙනී යනු ඇත. ඒ අනුව යමින් මේ ලෝකයේදීත් ඊළඟ ලෝකය සඳහා සූදානම් විය යුතුය. රාජධානි ලෝකය සඳහා අවශ්‍යදෑ මෙහිදී ලබාගෙන ඒ සඳහා සූදානම්විය යුතුය.ගර්භාෂ ලෝකයේදී මේ ලෝකය සඳහා අත්‍යාවශ්‍ය බලයන් ලබාගත් ආකාරයෙන්ම, රාජධානියේ ලෝකය සඳහා අවශ්‍යවන්නාවූ දේ එනම් සියළුම දිව්‍යමය බලයන් මේ ලෝකයේදී ලබාගත යුතුය.”**[14]

1. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යදැයි තීරණය කරන්න.
   - __________ මේ ලෝකය සඳහා අවශ්‍ය සියළුම බලයන් අප ගර්භාෂ ලෝකයේදී ලබා ගන්නෙමු.
   - __________ අයෙකුට මීළඟ ලෝකය සඳහා සූදානම්වීමේ අවශ්‍යතාවක් නැත.
   - __________ රාජධානියේ ලෝකය සඳහා අවශ්‍යදෑ අප මෙහිදී ලබාගත යුතුය.
   - __________ මීළඟ ලෝකයේ ජීවිතය සඳහා අවශ්‍ය බලයන් ලබාගැනීම මේ ජීවිතයේ අරමුණ වේ.
   - __________ සත්‍ය ජීවිතය ආරම්භවන්නේ කෙනෙකුගේ මරණින් පසු දිව්‍යමය රාජධානියට ගිය පසුවය.
   - __________ සත්‍ය ජීවිතය මේ ලෝකයේදී ආරම්භවී භෞතික මරණින් පසුවත් දිගටම පවතී.

2. මනුෂ්‍ය වර්ගයා ගර්භාෂ ලෝකයේදී ලබාගන්නා හැකියාවන් සමහරක් මොනවාද? __________________

   ______________________________________________

   ______________________________________________

3. මරණින් පසු ජීවිතය සඳහා අවශ්‍ය වන, මේ ලෝකයේදී ලබාගතයුතු උරුමයන් සමහරක් මොනවාද?

   ______________________________________________

   ______________________________________________

## 10 වන කොටස

බහාඋල්ලා තුමා මෙසේ ප්‍රකාශ කර ඇත.

**“දෙවියන්වහන්සේ විසින් තමන් වෙනුවෙන් වත් කරනු ලබන වරප්‍රසාද ධාරා ප්‍රමාණය ලබාගැනීම මෙදවස මනුෂ්‍යයාගේ සම්පූර්ණ යුතුකමයි. එමනිසා කිසිවෙක් භාජනයේ විශාල බව හෝ කුඩා බව නොසලකා හරිත්වා. මිනුමක් ලෙස සමහරෙකු ලැබෙන ප්‍රමාණය මිනිසෙකුගේ අත්ලට සරිලන ප්‍රමාණයද, තව සමහරෙකුට කෝප්පයක් පිරෙන තරමටද සහ තවත අයෙකුට ගැළුමක ප්‍රමාණයද වනු ඇත.”**[15]

1. ඉහත ඡේදයේ ලබාගත් අදහසට අනුව පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

I. මෙදවස සෑම තනි පුද්ගලයෙකුගේම කාර්යය වනුයේ කුමක්ද? ______________________________

______________________________________________________________________

II. දෙවියන්වහන්සේගෙන් ඔබට ලැබුණු ආශිර්වාදයන් සමහරක් මොනවාද? ____________________

______________________________________________________________________

______________________________________________________________________

III. ඉහත උද්ධෘත පාඨයේ ‘භාජනය’ යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? ____________________

______________________________________________________________________

IV. අපට උරුමවන හැකියාවේ ‘විශාල බව හෝ කුඩා බව’ පිළිබඳ අප නොසැලකිය යුත්තේ ඇයි? ___

______________________________________________________________________

______________________________________________________________________

______________________________________________________________________

______________________________________________________________________

V. දෙවියන්වහන්සේගේ වරප්‍රසාද ලැබීමෙන් අපව වළක්වනු ලබන සමහරක් කරුණු මොනවාද? ___

______________________________________________________________________

______________________________________________________________________

______________________________________________________________________

______________________________________________________________________

2. පහත ප්‍රකාශයන්ගෙන් නිවැරදි වන්නේ මොනවාද?

__________ අපගේ හැකියාවේ ‘විශාල බව හෝ කුඩා බව’ හි අදහස අප කෙතරම් බුද්ධිමත්ද යන්නයි.

__________ දෙවියන්වහන්සේට සේවය කිරීමට නම් අප අපගේ දුර්වලකම් අමතක කර දමා උන්වහන්සේ කෙරෙහි සම්පූර්ණ විශ්වාස තැබිය යුතුය.

__________ දෙවියන්වහන්සේ අප වෙත ප්‍රදානය කර ඇති හැකියාවන් අප මේ ලෝකය තුළදී සංවර්ධනය කර නොගතහොත් අප මීළඟ ලෝකයට යනවිට අපගේ ආත්ම දුර්වල තත්වයක පවතී.

## 11 වන කොටස

බහාඋල්ලා තුමා ප්‍රකාශ කර ඇති පරිදි;

**“ආත්මයේ ස්වාභාවය පිළිබඳ ප්‍රශ්නය ඔබ මගෙන් අසා ඇත. ආත්මය දෙවියන්වහන්සේගේ සංකේතයක් වන බව සහතික වශයෙන්ම දැනගන්න, දිව්‍යමය මාණික්‍යයේ සත්‍යතාවය මිනිසුන්ගෙන් ඉතා උගත් අයෙකුට පවා ග්‍රහණය කරගැනීමට නොහැකි, කොතරම් තීක්ෂණ මනසකට වුවද එහි අභිරහස් කිසිදිනක විසඳිය නොහැක. නිර්මාපිත සියළු දේවල් අතරින් නිර්මාතෘවරයාගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ ප්‍රකාශයට පත්කරන්නේත්, සෑමට කලින් උන්වහන්සේගේ ඓශ්වර්ය අවබෝධ කරගන්නේත්, උන්වහන්සේගේ සත්‍යයෙහි බැඳී සිටින්නේත් සහ උන්වහන්සේ ඉදිරිපිට හිසනමා නමස්කාරපූර්වකවන්නේත් එයයි.”**[16]

1. පහත වාක්‍යයෙහි හිස්තැන් පුරවන්න.

I. ආත්මය යනු දෙවියන්වහන්සේගේ ___________ කි.

II. ආත්මය ___________ වන අතර එහි _____________ මිනිසුන්ගෙන් ඉතා උගත් අයෙකුට පවා ග්‍රහණය කරගැනීමට නොහැකි, _________________ මනසකට වුවද එහි අභිරහස් කිසිදිනක ________________ නොහැක.

III. ආත්මය ____________________________________ පිළිබඳ ප්‍රකාශයට ___________________________.

IV. ආත්මය සැමට කලින් දෙවියන්වහන්සේගේ ______________________.

V. ආත්මය සැමට කලින් දෙවියන්වහන්සේගේ සත්‍යයෙහි ___________________.

VI. ආත්මය සැමට කලින් දෙවියන්වහන්සේ ඉදිරිපිට ______________________ නමස්කාරපූර්වකවේ.

2. පහත සඳහන් ප්‍රකාශයන්ගෙන් නිවැරදි වන්නේ කුමක්ද?

__________ 'විසඳීම' යන්නෙහි අර්ථය අවබෝධ කරගැනීමයි.

__________ සියළුම නිර්මාපිත දේ අතරින් පළමුවෙන්ම දෙවියන්වහන්සේ හඳුනගන්නේ මිනිසාගේ මොළයයි.

__________ 'තීක්ෂණ' යන්නෙහි අදහස තියුණු බවයි.

__________ හොඳින් ඉගෙනගත් පුද්ගලයෙකු ආත්මයේ අභිරහස් අවබෝධ කරගනී.

__________ විශිෂ්ඨ දාර්ශනිකයෙකුට පමණක් දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය විස්තර කළ හැක.

__________ ආත්මය පිළිබඳ අපට කිසිදා අවබෝධ කරගත නොහැකි හෙයින් ඒ පිළිබඳ සැලකිය යුතු නැත.

## 12 වන කොටස

බහාඋල්ලා තුමා මෙසේ ප්‍රකාශ කර ඇත.

**"නුඹලා, අතිමහත් ස්වර්ගය පුරා සම්පූර්ණ සහ ප්‍රීතිමත් විශ්වාසයෙන් තමාගේ ප්‍රබල පියාපත්වල සම්පූර්ණ බලය යොදවමින් සැරිසරමින් සිටි, කුසගින්න සන්සිඳුවා ගැනීමේ පෙළඹවීම නිසා පහළ පෘථිවියේ ඇති ජලය සහ පස් වෙත දැඩි ආශාවෙන් යුක්තව යොමුවීම නිසා සහ තමන්ගේ ආශාව නමැති දැලෙහි පැටලී සිටීමේදී තමන් පැමිණි ඉහළ රාජධානිය කරා නැවත පියාසර කිරීමට ඇති තමන්ගේ බලය හීනවූ බව අවබෝධකරගත් පක්ෂියෙකු හා සමාන වේ. මේ දක්වා ස්වර්ගයේ පදිංචිව සිටි ඒ පක්ෂියාට තමන්ගේ අපවිත්‍ර පියාපත්වල වූ කරදරකාරී බර ගසාදැමීමට නොහැකිව දැන් මේ දූවිල්ල මත තමන්ගේ වාසස්ථානය තනා ගැනීමට බලකරනු ලැබ ඇත. එම නිසා මාගේ සේවකයිනි, මාගේ දිව්‍යමය දැනීම නැමැති ස්වර්ගය කරා ඉහළට පියැඹීමෙන් වලක්වනු නොලැබෙනු වස් හිතුවක්කාරී සහ නිෂ්ඵල ආශාවන්ගෙන් ඔබලාගේ පියාපත් අපවිත්‍රවීමට නොදී ඊර්ෂ්‍යාව සහ වෛරය නැමැති දූවිල්ලේ කැළැල්වලින් පීඩාවිඳීමට ඉඩ නොදෙන්න."**[17]

1. පහත වාක්‍ය සම්පූර්ණ කරන්න.

I. බහාඋල්ලා තුමා විසින් මෙම උද්ධෘත පාඨයේ පක්ෂියා ලෙස සඳහන් කරන්නේ ______________________.

II. මෙම පක්ෂියා ______________________ පදිංචිකරුවෙකි.

III. මෙම පක්ෂියාගේ පියාපත් වැළැක්වීම නිසා පක්ෂියාට ________________ මත තම නිවාසය තැනීමට බලකර ඇත.

2. දැන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. ආත්මයේ 'පියාපත්' 'කැළැල්විය' හැක්කේ කෙසේද? ________________________________

________________________________________________________________

________________________________________________________________

II. ආත්මය නැමැති පියාපත් වල පැටවිය හැකි 'පෘථිවියේ ඇති ජලය සහ පස්' වැනි පීඩාකාරී දේවල් සමහරක් නම් කරන්න. ________________________________________________

________________________________________________________________

________________________________________________________________

III. දිව්‍යමය දැනුම නැමැති ස්වර්ගයේ සැරිසැරීමෙන් අපව වළක්වනු ලබන දේවල් කිහිපයක් නම් කරන්න. ________________________________________________________

________________________________________________________________

________________________________________________________________

IV. ආත්මය මේ ලෝකයේ දූවිලි වෙනුවෙන් තම ස්වර්ගීය නිවාසය මාරුකරන්නට ඇත්තේ ඇයි? ___

________________________________________________________________

________________________________________________________________

3. පහත ප්‍රකාශනයන්ගෙන් නිවැරදි වාක්‍ය මොනවාදැයි නිගමනය කරන්න.

________ භෞතික ලෝකයට ඇති බැඳීම අපගේ ආධ්‍යාත්මික ප්‍රගතියට බාධා පමුණුවයි.

________ අපගේ හිතුවක්කාරී සහ නිශ්ඵල ආශාවන් අපව දිව්‍යමය දැනුම නමැති ස්වර්ගය කරා පියඹීමෙන් වළක්වනු ලබයි.

________ ඊර්ෂ්‍යාව සහ වෛරය මනුෂ්‍ය වර්ගයාගේ ගතිලක්ෂණයක් වන හෙයින් එය ආත්මයට පීඩාවක් ඇති නොකරයි.

________ මේ ලෝකයට ඇති බැඳීමෙන් අප වෙන්වීමෙන් අපට අති මහත් ස්වර්ගය පුරා සැරිසැරීමට ඇති පීඩාකාරී දෑ වලින් නිදහස් විය හැක.

________ ආත්මයේ නිවහන මේ ලෝකයයි.

## 13 වන කොටස

බහාඋල්ලා තුමා මෙසේ පවසා ඇත.

**" දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ අසීමිත සහ ස්වෛරීය කැමැත්ත සෘජු ලෙසම ක්‍රියාවට නංවමින් මේ ලෝකයත් එහි ජීවත්වන සහ චංචල සියල්ලමත් නිර්මාණය කිරීමේදී , උන්වහන්සේ හඳුනාගැනීමේ සහ උන්වහන්සේට ආදරය කිරීමේ අසමසම ලක්ෂණය සහ හැකියාව ප්‍රධානය කිරීමට මනුෂ්‍ය වර්ගයා**

**තෝරා ගන්නා ලද අතර මෙම හැකියාව සකල නිර්මාණයම පාදක වූ ආරම්භක පෙළඹීම සහ මූලික අරමුණ ලෙස සැලකිය යුතුය.....නිර්මාණය කරන ලද සෑම සහ සියළු දෙයකම අභ්‍යන්තර සත්‍යතාව මත උන්වහන්සේගේ නාමයන්ගෙන් එකක ආලෝකය පතිතවීමට සහ උන්වහන්සේගේ ගුණාංගයන්ගෙන් එකක මහිමය ලබාගැනීමට හැකි කළ සේක. කෙසේවෙතත්, මනුෂ්‍යයාගේ සත්‍යතාව මත උන්වහන්සේගේ සියළුම නාමයන්ගේ සහ ගුණාංගයන්ගේ දීප්තිය නාභිගතකර උන්වහන්සේගේම කැඩපතක් බවට පත් කළ සේක. නිර්මාණය කරන ලද සියළුම දේ අතරින් මේ තරම් විශාල වරප්‍රසාදයක් සහ නොනැසෙන ත්‍යාගශීලිභාවයක් සඳහා තෝරා ගන්නා ලද්දේ මනුෂ්‍යයා පමණි.”18**

1. හිස්තැන් පුරවන්න.

   I. දෙවියන්වහන්සේ විසින් ________________________________ කිරීමේ අසමසම ලක්ෂණය සහ හැකියාව ප්‍රධානය කිරීමට මනුෂ්‍ය වර්ගයා තෝරා ගත් සේක.

   II. නිර්මාණය කරන ලද ________ සහ _______ දෙයකම අභ්‍යන්තර සත්‍යතාව මත ________________________________ ආලෝකය පතිතවීමට සහ ______________________________ මහිමය ලබාගැනීමට හැකි කළ සේක.

   III. මනුෂ්‍යයාගේ සත්‍යතාව මත උන්වහන්සේගේ ______________________________ ________________________ දීප්තිය නාභිගතකර ______________________ කැඩපතක් බවට පත් කළ සේක.

2. දැන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

   I. දෙවියන්වහන්සේගේ ගුණාංග කිහිපයක් නම් කළ හැකිද? ______________________________
   ________________________________________________________________
   ________________________________________________________________

   II. මනුෂ්‍ය ආත්මය මඟින් ප්‍රදර්ශන කළ හැකි දෙවියන්වහන්සේගේ ගුණාංගයන් සමහරක් මොනවාද? _
   ________________________________________________________________

   III. මෙම ගුණාංග විද්‍යාමාන කළ හැක්කේ කෙසේද? ______________________________
   ________________________________________________________________
   ________________________________________________________________

   IV. මනුෂ්‍ය වර්ගයා පමණක් තෝරාගෙන ඇත්තේ කුමන විශේෂිත වරප්‍රසාදයක් පිරිනැමීම සඳහාද? _____
   ________________________________________________________________

3. පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ මොනවාද?

________මනුෂ්‍ය වර්ගයා අනෙකුත් නිර්මාණයන්ගෙන් විශේෂිත නොවේ.

________දෙවියන්වහන්සේ හඳුනාගැනීමේ සහ උන්වහන්සේට ආදරය කිරීමේ හැකියාව සකල නිර්මාණයම පාදක වූ ආරම්භක පෙළඹීම සහ මූලික අරමුණ ලෙස සැලකිය යුතුය.

________දෙවියන්වහන්සේගේ ගුණාංගයන් එකක ප්‍රතිලාභියාවීම සියළුම නිර්මාපිතයන්ගේ සත්‍යතාවයයි.

________මනුෂ්‍ය ආත්මයට දෙවියන්වහන්සේගේ සියළුම ගුණාංගයන් ප්‍රදර්ශනය කිරීමේ හැකියාව ඇත.

## 14 වන කොටස

බහාඋල්ලා තුමා අපට මෙසේ පවසා ඇත.

**"දිව්‍යමය ත්‍යාගශීලීත්වයේ දිව්‍යතරුවෙහි සහ ස්වර්ගීය මාර්ගෝපාදේශකත්වයේ ප්‍රභවයන්ගේ ඇති ශක්තීන් මනුෂ්‍යයාගේ සත්‍යතාවය තුල දායාද කොට පවතින අතර, එසේවුවත්, ඉටි පන්දමක් තුළ ගිනි දැල්ල සැඟවී ඇති ආකාරයට සහ ලාම්පුවක් තුළ තිබිය හැකි ආලෝක කිරණ මෙන් එය ඔහු තුළ අප්‍රකටව පවතී. කණ්ණාඩියක් ආවරණය කර ඇති ලෙස තැවරුණු දූවිලි සහ අපවිත්‍ර දෑ යට සූර්යයාගේ ආලෝකය සැඟව පවතින්නාක් මෙන් ලෞකික ආශාවන් නිසා ඇතැම් විට මෙම ශක්තීන්ගේ දීප්තිය සැඟව පවතී. ඉටි පන්දමකට හෝ ලාම්පුවට යන දෙකින් එකටවත් කිසිදු ආධාරයකින් තොරව තමන්ගේම උත්සාහයෙන් ආලෝතමත් විය නොහැකි සේම කණ්ණාඩියකට එය විසින්ම එහි ඇති අපවිත්‍රදෑ කිසි දිනක ඉවත්කර ගත නොහැක. නිසැක සහ ප්‍රත්‍යක්ෂ ලෙසම ලාම්පුවක් ගිනි දල්වන තුරු කිසිදිනක එය විසින් පත්තු කරගත නොහැකි බවත් කණ්ණාඩියක එහි මුහුණත තැවරුණු අපවිත්‍රදෑ ඉවත් කරනතුරු කිසිදිනක් සූර්යායගේ ප්‍රතිබිම්බය නිරූපණය කිරීමට හෝ එහි ආලෝකය සහ තේජස පරාවර්ථනය කිරීමට නොහැකි බවත් පැහැදිලිය."**[19]

1. 'අප්‍රකට' යන වචනයෙහි තේරුම කුමක්ද? ____________________

2. මනුෂ්‍ය ආත්මයේ අප්‍රකටව ඇති බලයන් සමහරක් මොනවාද? ____________________

3. ලාම්පුවක ඇති හැකියාව කුමක්ද? ____________________

4. කණ්ණාඩියක ඇති හැකියාව කුමක්ද? ____________________

5. ලාම්පුව තුලින් ආලෝකය ලබාගැනීමට කළ යුත්තේ කුමක්ද? ____________________

6. කණ්ණාඩිය තුලින් ආලෝකය පරාවර්ථනය කිරීමට කළ යුත්තේ කුමක්ද? ____________________

7. ලාම්පුවකට හෝ කණ්ණාඩියකට එහි හැකියාවන් එය තුලින්ම ප්‍රකාශ කළ හැකිද? ____________________

8. මෙම උදාහරණ දෙක මනුෂ්‍ය ආත්මය හා සම්බන්ධ කළ හැක්කේ කෙසේද? ____________________

9. මනුෂ්‍ය ආත්මයේ හැකියාවන් ප්‍රකාශයට පත් කළහැක්කේ කාටද? ____________________

## 15 වන කොටස

බහාඋල්ලා තුමා මෙසේ සඳහන් කර ඇත.

**"පෞරාණික ආත්මභාවයේ දැනීමේ දොරටුව මනුෂ්‍යයාගේ මුහුණ ඉදිරිපිට අතීතයේදී වැසී තිබුණාක් මෙන්ම අනාගතයේදීද සදහටම වැසී තිබෙනු ඇත. උන්වහන්සේගේ ශුද්ධවූ රාජසභාව වෙත කිසිදු මනුෂ්‍යයකුගේ අවබෝධයට ළඟාවිය නොහැක. උන්වහන්සේගේ අනුකම්පාවේ සංකේතයක් ලෙසත්, උන්වහන්සේගේ ආදර කරුණාවේ සාක්ෂියක් ලෙසත් උන්වහන්සේ විසින් උන්වහන්සේගේ දිව්‍යමය මාර්ගෝපදශක්වයේ දිවාතරු මනුෂ්‍යා මත ප්‍රකාශයට පතත්කරමින් උන්වහන්සේගේ දිව්‍යමය ඒකීයභාවයේ සංකේතයක් ලෙස මෙම පාරිශුද්ධවූ ආත්මභාවයන් එතුමන්ලාටම අනන්‍යවූ තමන්වහන්සේගේම දැනුමට සමාන බවට පත්කළ සේක. එතුමන්ලා හඳුනාගත් අයෙක් දෙවියන්වහන්සේ හඳුනාගෙන ඇත. එතුමන්ලාගේ කැඳවීමට සවන් යොමු කළ අයෙක් දෙවියන්වහන්සේගේ හඬට සවන් යොමු කර ඇති අතර, එතුමන්ලාගේ අනාවරණයේ සත්‍යයට සාක්ෂවන තැනැත්තා දෙවියන්වහන්සේගේ සත්‍යයට සාක්ෂි දරනවා ඇත. එතුමන්ලාගෙන් ඉවත්වන තැනැත්තෙකු දෙවියන්වහන්සේගෙන් ඉවත්ව ඇති සේම එතුමන්ලා කෙරෙහි විශ්වාශ නොකරන්නෙකු දෙවියන්වහන්සේ විශ්වාස නොකරන්නෙකුද වේ. එතුමන්ලා සෑම කෙනෙකුම ඉහළ රාජධානිය හා මේ ලෝකය සම්බන්ධ කරනු ලබන දෙවියන්වහන්සේගේ මාර්ගයන් වන අතර, පෘථිවි සහ ස්වර්ග රාජධානිවල සිටින සෑම කෙනෙකුම ඉදිරියේ උන්වහන්සේගේ සත්‍ය වෙනුවෙන් පෙනීසිටිනා අයවළුන් වෙති. එතුමන්ලා මනුෂ්‍යයින් අතර දෙවියන්වහන්සේගේ ප්‍රකාශවීම්ද, උන්වහන්සේගේ සත්‍යයේ සාක්ෂීන් සහ උන්වහන්සේගේ මහිමයේ සංකේතයන්ද වෙති."**[20]

1. ඉහත උද්ධෘත පාඨය සිත්හි තබාගෙන පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

I. අපට කෙළින්ම දෙවියන්වහන්සේ හඳුනාගැනීමේ හැකියාව තිබේද? ____________________________

II. එසේනම් අපට දෙවියන්වහන්සේ හඳුනාගත හැක්කේ කෙසේද? ________________________________

____________________________________________________________________________

III. දිව්‍යමය මාර්ගෝපදේශකත්වයේ දිවාතරු කිහිපයක් නම් කරන්න. ____________________________

____________________________________________________________________________

IV. දෙවියන්වහන්සේගේ ප්‍රකාශවීම් වලට සවන්දුන් අයෙක් කාගේ හඬට සවන් දුන් අය වෙත්ද? _______

____________________________________________________________________________

V. දෙවියන්වහන්සේගේ ප්‍රකාශවීම්වල කැඳවීම නොසලකා හැරීමෙන් අප ඉවත්වන්නේ කාගෙන්ද? ____

2. පහත සඳහන් වාක්‍ය සම්පූර්ණ කරන්න.

I. පෞරාණික ආත්මභාවයේ දැනීමේ දොරටුව __________________________ අතීතයේදී වැසී තිබුණාක් මෙන්ම ________________________________ ඇත.

II. _________________________________________ වෙත කිසිදු මනුෂ්‍යයකුගේ අවබෝධයට ළඟාවිය නොහැක.

III. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ________________________ සංකේතයක් ලෙසත්, උන්වහන්සේගේ__________________________ සාක්ෂියක් ලෙසත් උන්වහන්සේගේ ප්‍රකාශවීම් එවා ඇත.

IV. දෙවියන්වහන්සේගේ ප්‍රකාශවීම් එතුමන්ලාටම අනන්‍යවූ ________________________ ________________________ පත්කළ සේක.

V. එතුමන්ලා හඳුනාගත් අයෙක් ________________ ඇත.

VI. එතුමන්ලාගේ කැඳවීමට සවන් යොමු කළ අයෙක් ________________ ________________යොමු කර ඇත.

VII. ________________________________________

එතුමන්ලා සෑම කෙනෙකුම ඉහළ ________________

දෙවියන්වහන්සේගේ මාර්ගයන් වන අතර, ________________

________________________________________

3. පහත ප්‍රකාශනයන්ගෙන් නිවැරදි වන්නේ මොනවාද?

__________ අපගේ තනි උත්සාහය මඟින් අපට ආධ්‍යාත්මිකව වර්ධනය විය හැක.

__________ දෙවියන්වහන්සේ අපට බුද්ධිය ලබාදී ඇති අතර අපගේ ප්‍රගතියට එය ප්‍රමාණවත්ය.

__________ දෙවියන්වහන්සේගේ ප්‍රකාශවීම් හඳුනාගැනීම තුළින් අපට ආධ්‍යාත්මිකව ප්‍රගතිය කරා යාහැකි අතර ඉන් ඉදිරියට තවත් උත්සාහයන් ගතයුතු නැත.

__________ දෙවියන්වහන්සේගේ ප්‍රකාශවීම් හඳුනාගැනීම තුළින් හා උන්වහන්සේගේ ඉගැන්වීම් වලට අනුකූලව ජීවත්වීමට උත්සාහ කිරීම තුළින් අපට ආධ්‍යාත්මිකව ප්‍රගතියට යාහැක.

__________ අපට දෙවියන්වහන්සේ කෙළින්ම හඳුනාගත හැක.

__________ මනුෂ්‍ය වර්ගයාට දෙවියන්වහන්සේ වැනි විය හැක.

__________ දෙවියන්වහන්සේගේ උසස් බව මනුෂ්‍යයාගේ අවබෝධයට වඩා අධිකතරවේ.

__________ අප දෙවියන්වහන්සේගේ ප්‍රකාශවීම්වල වචනයන්ට සවන්දෙන විට අප දෙවියන්වහන්සේගේ හඬට සවන්දුන්නා හා සමාන වේ.

## 16 වන කොටස

බහාඋල්ලා තුමා මෙසේ ප්‍රකාශ කර ඇත.

**"අනාගතවක්‍තෘවරුන් සහ දෙවියන්වහන්සේගේ ප්‍රකාශවී මේ මෙලොවට එවීමේ එකම අභිප්‍රාය මනුෂ්‍ය වර්ගයාට සත්‍යයේ ඍජු මාර්ගයට මඟපෙන්වීම සඳහායි. මනුෂ්‍යයා තම අවසාන මොහොතේදී අතිඋත්කෘෂ්ඨ සිංහාසනය කරා ගමන් කිරීමේදී පරම පවිත්‍රත්වයෙන් සහ ශුද්ධවන්තබවින් හා සම්පූර්ණ මධ්‍යස්ථතාවයෙන් යුතුවීමට පුහුණු කිරීම එතුමන්ලාගේ අනාවරණයේ ගැබ්ව ඇති එකම අරමුණයි."**[21]

තවත් ඡේදයක එතුමා මෙසේ පවසා ඇත.

**"මනුෂ්‍යයා ශ්‍රේෂ්ඨතම යන්ත්‍රයයි. එසේ වුවද, නිවැරදි අධ්‍යාපනයක් නොලැබීම නිසා ඔහුට සහජයෙන් බුක්තිවිඳිය හැකිදෑ අහිමිව ගොස් ඇත. දෙවියන්වහන්සේගේ ශ්‍රී මුඛයෙන් නිකුත්වූ එක් වචනයකින් ඔහුට පැවැත්ම ඇති වූ අතර; තවත් වචනයකින් ඔහුගේ අධ්‍යාපනයේ ප්‍රභවය හඳුනාගැනීමට මඟපෙන්වනු ලැබූ අතර; තවත් එක් වචනයකින් ඔහුගේ තත්වය සහ ඉරණම ආරක්ෂා කළ සේක. ශ්‍රේෂ්ඨ ආත්ම භාවය පවසා සිට සේක් නම්; මනුෂ්‍යයා මිළ කළ නොහැකි වටිනාකමකින් යුත් මාණික්‍යයන්ගෙන් පිරි ආකරයක් ලෙස සලකන්න යනුවෙනි. මනුෂ්‍යයාට ප්‍රයෝජනයට ගතහැකි පරිදි එහි අඩංගු වස්තූන් අනාවරණය කළ හැක්කේ අධ්‍යාපනයට පමණි. දෙවියන්වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත නමැති ස්වර්ගයෙන් එවනු ලැබූ ශුද්ධවූ ලියවිල්ල යමෙකු ගැඹුරු ලෙස අධ්‍යනය කළහොත් සියළුම මිනිසුන් එක් ආත්මයක් ලෙස සලකනු ලැබීම එහි අරමුණ ලෙස පහසුවෙන්ම අඳිනගනු ලබන අතර එමඟින් 'රාජධානිය දෙවියන්වහන්සේගේ වන්නේය' යන වචනය අඩංගු මුද්‍රාව සෑම හදවතකම මුද්‍රා තබමින් දිව්‍යමය මාර්ගෝපදේශකත්වයේ ආලෝකයෙන්, එහි අලංකාරයෙන් සහ කරුණාවෙන් සියළුම මනුෂ්‍ය වර්ගයා වෙළාගනු ඇත."**[22]

1. අනාගතවක්තෘවරුන් සහ දෙවියන්වහන්සේගේ ප්‍රකාශවීම් මෙලොවට පැමිණීමේ අරමුණ කුමක්ද? ____

2. එතුමන්ලාගේ අනාවරණයේ ගැබ්ව ඇති අරමුණ කුමක්ද? ____

3. ‘යන්ත්‍රය’ යන වචනයෙහි අර්ථය කුමක්ද? ____

4. නිවැරදි අධ්‍යාපනයක් නොමැතිවීමෙන් කුමන ප්‍රතිවිපාකයක් ඇතිවේද? ____

5. නිවැරදි අධ්‍යාපනයකින් සිදුවිය හැක්කේ කුමක්ද? ____

6. අපගේ අධ්‍යාපනයේ ප්‍රභවය කුමක්ද? ____

7. අපගේ ඉරණම කුමක්ද? ____

8. අධ්‍යාපනය මඟින් අනාවරණය කරන මාණික්‍යයන් සමහරක් මොනවාද? ____

9. අප ශුද්ධවූ ලේඛනයන් ගැඹුරින් අධ්‍යනය කරනවිට පහසුවෙන්ම හඳුනාගන්නේ කුමක්ද? ____

## 17 වන කොටස

බහාඋල්ලා තුමා මෙසේ සඳහන් කර ඇත.

**“ශරීරයෙන් වෙන්වීමෙන් පසු ආත්මයේ ස්වභාවය පිළිබඳ ඔබ තවදුරටත් මගෙන් අසා ඇත. ඔබ විසින් දැනගත යුතු සත්‍යනම්, මනුෂ්‍යය ආත්මය දෙවියන්වහන්සේගේ මාර්ගයෙහි ගමන් කර තිබේනම් සහතික ලෙසම එය නැවත ගොස් ආදරණීයයන්ගේ ශ්‍රේෂ්ඨත්වයට හා එක් වන බවයි. දෙවියන්වහන්සේගේ ධාර්මිකත්වයේ නාමයෙන්! එය කිසිම පෑනකින් ලිවිය නොහැකි හෝ කිසිම දිවකින් විස්තර කළ**

**නොහැකි තත්වයකට පත්වනු ඇත. ආත්මයක්, දෙවියන්වහන්සේගේ ධර්මයට භක්තියෙන් රැදීසිට, උන්වහන්සේගේ මාර්ගයෙහි නොසැලී ශක්තිමත්ව සිටිගත්තේ නම් ඔහුගේ මරණින් පසු ඔහු තුළින් සර්වබලධාරීන්වහන්සේ විසින් නිර්මාණය කරන ලද සියළුම වචනයන්ගේ ප්‍රයෝජන ලබාගත හැකි අන්දමේ බලයක් හිමිවනු ඇත.”**[23]

1. පහත සඳහන් වාක්‍ය සම්පූර්ණ කරන්න.

I. මනුෂ්‍යය ආත්මය දෙවියන්වහන්සේගේ මාර්ගයෙහි ගමන් කර තිබේනම් සහතික ලෙසම ______________________________ වනු ඇත.

II. ______________________________ නොහැකි තත්වයකට පත්වනු ඇත.

III.______________, ______________ ______________ රැදීසිට,______________නොසැලී ______________ නම් ______________ පසු ඔහු තුළින් ______________ විසින් ______________ කරන ලද සියළුම වචනයන්ගේ __________ ලබාගත හැකි අන්දමේ __________ හිමිවනු ඇත.

## 18 වන කොටස

බහාඋල්ලා තුමා අපට කියා සිටින්නේ:

**“ලෝකයේ මිනිසුන්ගේ ආත්මයන් ශරීරයෙන් වෙන් වන අවස්ථාවේදී හිස් සිතුවිලි වලින් පවිත්‍රවන එම ආත්මයන් අශිර්වාදයෙන් යුත්වනු ඇත. එවැනි ආත්මයක් තම නිර්මාතෘවරයාගේ කැමැත්තට අනුකූලව ජීවිත් වෙමින් සහ ක්‍රියාකිරීමෙන් උසස්තම පිරිදීසයට ඇතුළුවනු ඇත. උසස්තම මන්දිරයේ වෙසෙන ස්වර්ගීය සේවිකාවන් එය වටා එක්වන අතර, දෙවියන්වහන්සේගේ අනාගතවක්තෘවරුන් සහ උන්වහන්සේගේ තෝරගත්තවූවන් එහි සමාගමය පතනු ලබයි. ඔවුන් සමඟ නිදහසේ සංවාදයේ යෙදෙන අතර සියළුම ලෝකයන්ගේ ස්වාමීන් වූ දෙවියන්වහන්සේගේ මාර්ගයෙහි එයට ඉවසා දැරීමට සිදුවූයේ මොනවාදැයි ඔවුන්ට නැවත විස්තර කරනවා ඇත.”**[24]

**“තමන්ගේ අවසානය පිළිබඳ කිසිවෙකුත් නොදන්නා නිසා පව්කාරයින්ට සමාව දියයුතු අතර ඔවුන්ගේ පහත් තත්වයට කිසිවිටකත් අවමන් නොකළ යුතුය. කොපමණ අවස්ථාවන්වලදී පව්කාරයින් මරණයට පත්වන අවස්ථාවේදී භක්තියේ සාරයට පත්ව අමරණීය මධුවිත කටපුරා පානය කොට ඉහළ ජනසමූහයා වෙත පියාසර කර ඇත්ද, එමෙන්ම කොපමණ අවස්ථාවන්වලදී භක්තිමත් බැතිමතුයන් ඔවුන්ගේ ආත්මයන් ස්වර්ගාරෝහණය වන අවස්ථාවේදී අපාගින්නට වැටෙන්නට තරම් වෙනස්වී ඇත්ද!”**[25]

1. අපගේ ආත්ම ශරීරයෙන් වෙන් වන අවස්ථාවේදී කුමන තත්වයේ පැවතිය යුතුද? ______________
______________________________

2. හිස් සිතුවිලි සමහරක් මොනවාද? ______________________________
______________________________
______________________________
______________________________

3. හිස් සිතුවිලි වලින් පවිත්‍රවූ ආත්මයක් මරණින් පසු ජීවිතය සහ ක්‍රියාකිරීම කුමන තත්වයක යටතේ සිදුවෙයිද? ___

___

___

___

4. එවැනි ආත්මයක් හා සම්බන්ධ වන්නේ කවුරුන්ද? ___

___

5. එවැනි ආත්මයකට දෙවියන්වහන්සේගේ අනාගතවක්තෘවරුන් හා උන්වහන්සේගේ තෝරගත්තවුන් සමඟ සංවාදයේ යෙදිය හැකිද? ___

6. අපගේ ලෞකික ජීවිතය කවදා කෙසේ අවසන් වේව දැයි අප දන්නේද? ___

7. අපට නියමකර ඇති සදාකාලික ජීවිතය අත්පත් කර ගැනීමට දැන් අපට කුමක් කළ හැකිද? ___

___

___

## 19 වන කොටස

අබ්දුල් බහාතුමා මෙසේ විස්තර කරයි.

**"අනෙකුත් සියළුම ජීවමාන දෑ මෙන්ම, භෞතික රාමුව ඉවත් කර දැමීමෙන් පසුවද මනුෂ්‍ය ආත්මය සදාකාලිකවම පවතින අතර, සැකයක් නොමැතිවම සංවර්ධනයවීමේ හැකියාවද, වෙන්වී ගිය ආත්මයෙහි ප්‍රගතිය වෙනුවෙන් අන්අයට යාඥා කිරීමේ අවසරයද, සමාවට භාජනයවීමටද, දිව්‍යමය ආධාරයෙන්, පරිත්‍යාගයන් සහ අනුග්‍රහන්හි ප්‍රතිලාභියෙකු වීමටද හැකියාව පවතී. එම කාරණය හේතුවෙන්, බහාඋල්ලා තුමාගේ යාඥාවල, මීළඟ ලෝකයට සම්ප්‍රාප්තවූවන් වෙනුවෙන් දෙවියන්වහ්නසේගේ දායානුකම්පාව සහ ක්ෂමායුක්තභාවය බැගෑපත්ව ඉල්ලා සිටී. තවදුරටත් මනුෂ්‍යයාට මේ ලෝකයේදී දෙවියන්වහන්සේ අවශ්‍ය වන්නාක් මෙන්ම, මීළඟ ලෝකයේදීද දෙවියන්වහන්සේ අවශ්‍ය වනු ඇත. නිර්මාණයන්ට මේ අවශ්‍යතාවය නිරන්තරවම පවතින අතර මෙලොවදී මෙන්ම පරලොවෙහිදීද දෙවියන්වහන්සේ සර්ව ස්වාධීන වන සේක."**[26]

අප වෙන්වී ගිය ආත්මයන් වෙනුවෙන් යාඥා කළ යුත්තේ ඇයි?

___

___

___

___

___

___

___

___

## 20 වන කොටස

අබ්දුල් බහාතුමා මෙසේ සඳහන් කරයි.

**"මනුෂ්‍ය ආත්මය මෙම අනිත්‍ය දූවිලි ගබඩාවෙන් මිදී දෙවියන්වහන්සේගේ ලෝකයට ළඟාවූවිට ආවරණයන් ඉවත්වී, සත්‍ය ස්වරූපය අනාවරණයවී, කලින් නොදැන සිටි සියල්ල සුපැහැදිලිවී, සැඟවී තිබූ සත්‍යයන් අවබෝධ කරගන්නවා ඇත."**

**"යම්කිසි ආත්ම භාවයක් ගර්භාෂ ලෝකය තුළදී කණ් නොඇසී, ඇස් නොපෙනී, දිව ගොළුවී සිටින අන්දම ගැන සලකා බලන්න. ඔහු කිසිම හැඟීමකින් තොරව සිටියේය. නමුත් ඔහු ඒ අන්ධකාර ලෝකයෙන් පිටවී ආලෝකයෙන් යුත් ලෝකයට බිහිවූවිට ඔහුගේ ඇස් පෙනීමටත්, කණ් ඇසීමටත්, දිවෙන් කතා කිරීමටත් හැකිවේ. ඒ අයුරින්ම, ඔහු මේ මැරෙන සුළු ස්ථානයෙන් කඩිනමින් පිටත්වී දෙවියන්වහන්සේගේ රාජධානියට පිටත්වූ විට ඔහු ආත්මයෙන් ඉපදී, අවබෝධයේ ඇස් විවෘතවී, ඔහුගේ ආත්මයේ කණ් ඇසීමට පටන්ගෙන, ඔහු කලින් නොදැන සිටි සත්‍යයන් සරළව පැහැදිලි වනු ඇත."[27]**

1. පහත සඳහන් හිස්තැන් පුරවන්න.

I. මනුෂ්‍ය ආත්මය මේ ලෝකය හැරගිය විට

- ආවරණයන් ____________________
- සත්‍ය ස්වරූපය ______________________________
- කලින් නොදැන සිටි ____________________________________________
- සැඟවී තිබූ සත්‍යයන් _________________________

II. යම්කිසි ආත්ම භාවයක් _________________ තුළදී _____________, ______________, දිව __________ සිටින අන්දම ගැන සලකා බලන්න.

III. ඔහු ඒ අන්ධකාර ලෝකයෙන් පිටවී ආලෝකයෙන් යුත් ලෝකයට බිහිවූවිට ඔහුගේ ඇස් ____________, කණ් ____________, දිවෙන් ________________ හැකිවේ.

IV. ඒ අයුරින්ම, ඔහු මේ මැරෙන සුළු ස්ථානයෙන් කඩිනමින් පිටත්වී ___________________ __________ පිටත්වූ විට

V. ඔහු _________________, අවබෝධයේ ඇස් ______________, ඔහුගේ ආත්මයේ _________________ පටන්ගෙන, ඔහු කලින් ___________________ _________ සරළව පැහැදිලි වනුඇත.

2. පහත සඳහන් කුමන ප්‍රකාශයන් සත්‍යදැයි තීරණය කරන්න.

________අප මව්කුස තුළ සිටින කාලය ඇතුළත, මේ ලෝකය පිළිබඳ දැනුවත්ය.

________අපගේ මරණයෙන් පසු ජීවිතයේ තත්වය මේ ජීවිතයේ සැඟවුණු සත්‍යයක් ලෙස පවතී.

________මරණයෙන් පසු සම්පූර්ණයෙන්ම නව ක්ෂතිජයන් අප ඉදිරියේ විවෘත වනු ඇත.

________අප මිය ගිය පසු, නැවතත් මෙම ලෝකයෙහි ඉපදේ.

## 21 වන කොටස

බහාඋල්ල තුමා මෙසේ සඳහන් කරයි.

"දැන් ශරීරයෙන් වෙන්වූ පසුද මනුෂ්‍ය ආත්මය එකිනෙකා පිළිබඳ අවබෝධය දිගටම පවතිනවාදැයි ඔබ නැඟූ ගැටළුව සම්බන්ධවයි. රක්ත වර්ණ නෞකාව තුළට ඇතුළුව ස්ථිරව සිටින අයවළුනි, ඔබලා එකිනෙකා සමඟ සමාගමයේ යෙදෙන අතර කුළුපගව සංවාද ඇති කරගනිමින්, ඔවුන් සමඟ සමීපව වාසය කරමින්, ඔවුන්ගේ අභාලාෂයන්ගෙන්, අභිප්‍රායන් සහ පරමාර්ථයන්ගෙන් එක් ආත්මයක් මෙන් වීමට උත්සාහ දරනු ඇත. සැබවින්ම මොවුන්, හොඳින් දැනුවත්, තියුණු දර්ශනයකින් හෙබි, දැනුමින් යුක්ත අයවළුන් වෙති. සර්වඥවූත්, සර්වප්‍රාඥවූත් එතුමාණන් අණ කර ඇත්තේ මෙලෙසයි.

"බහාගේ මිනිසුනි, එකම සහ සියළු දෙවියන්වහන්සේගේ නෞකාවේ නිවැසියනි, ඔබලා එකිනෙකාගේ තත්වය හා ස්වභාවය පිළිබඳව හොඳින් දැනුවත් අතර මොවුන් දැඩි මිත්‍රත්වයකින් සහ සහයෝගිත්වයේ බන්ධනයෙන් එක්සත්වී සිටිති. එවැනි තත්වයක් ඔවුන්ගේ භක්තිය හා පැවැත්ම මත රඳා පවතී. ඔවුන් සමාන තරාතිරමේ සහ තත්වයේ අයවළුන්ගේ හැකියාවන්, ලක්ෂණ, ජයග්‍රහණයන් මෙන්ම සුදුසුකම් පිළිබඳවද හොඳින් දැනුවත්ය. කෙසේ නමුත් පහළ මට්ටමේ ආත්මයන්ට තමන්ට වඩා ඉහළ මට්ටමක ඇති ආත්මයන්ගේ තත්වය අවබෝධ කරගැනීමට හෝ ජයග්‍රහණයන් පිළිබඳව තක්සේරු කිරීමටද නොහැකිය. සැම කෙනෙකුගේම කොටස දෙවියන්වහන්සේ වෙතින් ලැබෙනු ඇත. දෙවියන්වහන්සේ දෙසට මුහුණ යොමා එතුමන්ගේ ප්‍රේමය තුළ අචලව ගමන්කර සර්ව සෛවරී ස්වාමීන්වූත්, සර්ව ශක්තිධරවූත්, සදාක්ෂමායුක්තවූත්, සර්ව සානුකම්පිතවූත් දෙවියන්වහන්සේ වෙත සිය ආත්මය ආරෝහණය වීමට සලස්වන මනුෂ්‍යයා ආශිර්වාද ලද්දෙකි."[28]

1. මේ ලෝකයේදී අප දැනසිටි මිනිසුන්, මීළඟ ලෝකයේදී අප විසින් හඳුනාගනු ලබයිද? ______________

______________________________________________

2. මීළඟ ලෝකයේදී ආත්මයන් අතර සමාගමය කෙතරම් සමීපද? ______________________________

______________________________________________

3. මීළඟ ලෝකයේදී ආත්මයන් අතර වෙනස්කම් හා ලක්ෂණයන් තීරණය වන්නේ කුමක් මතද? ________

______________________________________________

4. දෙවියන්වහන්සේගේ අනුග්‍රහය කිසිවෙකුටත් අභිමිවිය හැකිද? ______________________________

## 22 වන කොටස

බහාඋල්ලා තුමා අපට මෙසේ අනුශාසනා කරයි.

"මාගේ සේවකයිනි! මේ භෞතික ලෝකයේදී මේ දිනවල දෙවියන්වහන්සේ ඔබලාගේ බලාපොරොත්තුවලට ප්‍රතිවිරුද්ධ දේ නියම කර ප්‍රකාශයට පත්කර තිබෙනම් දුක් නොවන්න. ප්‍රීති ප්‍රමෝධයෙන් යුත් ස්වර්ගීය සොම්නසින් පිරි දිනයන් සහතික වශයෙන්ම ඔබලා වෙනුවෙන් සූදානම්ව තිබේ. ශුද්ධවූ සහ ආධ්‍යාත්මිකත්වයෙන් කීර්තිමත්වූ ලෝකයන් ඔබලාගේ ඇසි ඉදිරිපිට අනාවරණය වනු ඇත. මේ ලෝකයේදී සහ ඊට පසුවත්, ඒවායේ වාසි භුක්තිවිඳ ඒවායේ ප්‍රීතියට හවුල්වී, ඒවායේ පවතින වරප්‍රසාදයන්ගෙන් කොටසක් ලබාගැනීමට උන්වහන්සේ ඔබට ඉරණම් කොට ඇති සේක. ඒවායින් සැම සියළු එකකටම ඔබ ළඟාවන බවට කිසිම සැකයක් නැත."[29]

1. පහත සඳහන් ඒවායින් සත්‍යවන්නේ මොනවාද?

________අපට අවශ්‍ය අන්දමට දේවල් සිදු නොවන විටදී අප ශෝකයට පත්විය යුතුයි.

________හොඳ හෝ නරක හෝ වේවා ඒවා දෙවියන්වහන්සේගේ නියමයන්ට අනුව සිදුවේ.

________අප සියළු දෙනා වෙනුවෙන්ම ප්‍රීතිමත් දිනයන් සූදානම්ව තිබේ.

________ශුද්ධවූ සහ ආධ්‍යාත්මිකව කීර්තිමත් ලෝකයන් අපට අනිවාර්යයෙන් දැකිය හැක.

________මේ ලෝකයේ සහ මීළඟ ලෝකයේ ශුද්ධවූ සහ ආධ්‍යාත්මිකව කීර්තිමත් ලෝකයන්හි වාසි ලබාගැනීමට

2. අපගේ බලපොරොත්තුවලට පටහැනි දේ සිදුවනවිට අප දුකට පත් නොවිය යුත්තේ ඇයි? ____________

____________________________________________________________

____________________________________________________________

____________________________________________________________

3. ඉහත පාඨයේ බහාඋල්ලා තුමා අප වෙනුවෙන් ලබාදී ඇති පොරොන්දු මොනවාද? ________________

____________________________________________________________

____________________________________________________________

____________________________________________________________

## 23 වන කොටස

මේ ඒකකයේදී, මනුෂ්‍ය ජීවිතයේ අරමුණ පිළිබඳව ඔබ සමාලෝචනය කරන්නට ඇත. මෙහෙදී ආත්මයේ ස්වභාවය පිළිබඳවත්, මේ ලෝකයේදී ජීවිතයේ අරමුණ, ආධ්‍යාත්මික ගුණාංග සංවර්ධනය කරගැනීමේ අවශ්‍යතාව, ඉසුරුමත් සහ ප්‍රමෝධයෙන් පිරි, සදාතනික ජීවිතය පිළිබඳව ලබාදී ඇති පොරොන්දුව සම්බන්ධව විශාල වශයෙන් අධ්‍යනය කර ඇත. මෙම පොතෙහි දෙවන ඒකකයේදී, ද්විත්ව අරමුණ වන- අපගේ ආධ්‍යාත්මික සහ බුද්ධිමය සංවර්ධනය මෙන්ම සමාජීය පරිවර්ථනයට දායකවීම පිළිබඳවද අප කතා කරන්නට විය. එම සංකල්පයට නැවත වරක් යොමුවී ආත්මයේ සංවර්ධනය පිළිබඳ ඔබ ලබාගත් අන්තර්දෘෂ්ඨියේ අවබෝධයෙන් මෙම අරමුණෙහි ස්වාභාවයන් ද්විත්වයට යොමුවී එහි සුවිශේෂිභාවය පිළිබඳව කල්පනා කර බලමු. පහත සඳහන් තේමාවන් පිළිබඳව කණ්ඩායම සමඟ සාකච්ඡා කිරීමට ඔබගේ පෙර සමාලෝචනයන් උපකාර වනු ඇත.

*1. ආධ්‍යාත්මික ගුණාංග සංවර්ධනය කරගැනීම.*
*2. දෙවියන්වහන්සේගේ නීතිවලට කීකරුවීම.*
*3. මනුෂ්‍ය වර්ගයාගේ සුභසිද්ධිය සඳහා දායකවීම.*
*4. සේවා මාර්ගයේ ඉදිරියට යාම.*

**REFERENCES**

1. From a talk given on 10 November 1911, published in Paris Talks: Addresses Given by ‘Abdu’l-Bahá in 1911 (Wilmette: Bahá’í Publishing, 2006, 2016 printing), no. 29.12–13, p. 109.

2. From a letter dated 1 April 1946 written on behalf of Shoghi Effendi, published in Lights of Guidance: A Bahá’í Reference File (New Delhi: Bahá’í Publishing Trust, 1988, 2010 printing), no. 1820, p. 537.

3. From a letter dated 28 July 2016 written on behalf of the Universal House of Justice.

4. ‘Abdu’l-Bahá, in Some Answered Questions (Wilmette: Bahá’í Publishing, 2014, 2016 printing), no. 66.3, pp. 352–53.

5. Ibid., no. 38.5, p. 220.

6. From a talk given by ‘Abdu’l-Bahá on 9 November 1911, published in Paris Talks, no. 28.16, p. 104.

7. From a letter dated 31 December 1937 written on behalf of Shoghi Effendi, published in Lights of Guidance, no. 680, p. 204.

8. Gleanings from the Writings of Bahá’u’lláh (Wilmette: Bahá’í Publishing Trust, 1983, 2017 printing), LXXXII, par. 8, p. 183.

9. ‘Abdu’l-Bahá, in Some Answered Questions, no. 61.1–2, p. 334.

10. Gleanings from the Writings of Bahá’u’lláh, LXXX, par. 2, p. 174.

11. Ibid., LXXXI, par. 1, p. 176.

12. Ibid., CLXV, par. 1–3, pp. 391–92.

13. Bahá’u’lláh, The Hidden Words (Wilmette: Bahá’í Publishing Trust, 2003, 2012 printing), Arabic no. 32, p. 11.

14. From a talk given on 6 July 1912, published in The Promulgation of Universal Peace: Talks Delivered by ‘Abdu’l-Bahá during His Visit to the United States and Canada in 1912 (Wilmette: Bahá’í Publishing, 2012), pp. 315–16. (authorized translation)

15. Gleanings from the Writings of Bahá'u'lláh, V, par. 4, p. 8.

16. Ibid., LXXXII, par. 1, pp. 179–80.

17. Ibid., CLIII, par. 6, pp. 370–71.

18. Ibid., XXVII, par. 2, pp. 72–73.

19. Ibid., XXVII, par. 3, p. 73.

20. Ibid., XXI, par. 1, pp. 54–55.

21. Ibid., LXXXI, par. 1, p. 177.

22. Ibid., CXXII, par. 1, pp. 293–94.

23. Ibid., LXXXII, par. 7, p. 182.

24. Ibid., LXXXI, par. 1, pp. 176–77.

25. Ibid., CXXV, par. 3, pp. 300–1.

26. 'Abdu'l-Bahá, in Some Answered Questions, no. 62.3, pp. 340–41.

27. Selections from the Writings of 'Abdu'l-Bahá (Wilmette: Bahá'í Publishing, 2010, 2015 printing), no. 149.3–4, pp. 246–47.

28. Gleanings from the Writings of Bahá'u'lláh, LXXXVI, par. 1–2, pp. 192–93.

29. Ibid., CLIII, par. 9, p. 373